ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

" ඔවුන් කෙළවර දක්වා ම ගලවන්නට උන්වහන්සේට පුළුවන" (හෙබ්‍රෙව් 7:25)

75 වන වෙළුම අංක 12 (900) 2016 දෙසැම්බර්

ඔබ තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේ

චාර්ලස් එච්. ස්පර්ජන් විසිනි.

"පූර්ව කාලවලද, පරම්පරා වල ද, පටන් සැඟ වී තිබී දැන් දෙවියන් වහන්සේගේ ශුද්ධවන්තයන් ට ප්‍රකාශ වුණා වූ රහස වන දෙවියන් වහන්සේගේ වචනය සම්පූර්ණ කිරීමට නුඹලා උදෙසා මට දෙන ලද, උන්වහන්සේගේ ගබඩාකාරකමේ හැටියට සභාවේ සේවකයෙක් කරනු ලැබීම්. අනය ජාතීන් අතරේ තිබෙන මේ රහසේ තේජස් සම්පත කිමෙක් ද කියා දෙවියන් වහන්සේ ශුද්ධවන්තයින් ට දන්වන්නට කැමති වූ සේක. ඒ වනාහි තේජසේ බලාපොරොත්තු ව වන නුඹලා තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේ ය ." (කොලොස්සි 1:25-27)

සුභාරංචියේ මහත් වූ රහස අභිරහස් වල අභිරහසකි. තේජසේ බලාපොරොත්තුව වන ක්‍රිස්තුස් වහන්සේ නුඹලා තුළ වාසය කරන විට මෙම තේජස් සම්පතේ අබිරහස පැහැදිලිව විවෘත වී ප්‍රදර්ශනය වෙනවා දකින්නට හැකියාව ලැබෙන්නේ ය. ක්‍රිස්තුස් වහන්සේ මෙම අභිරහසේ කේන්ද්‍රස්ථානයයි. මේ දවස් වල දී ප්‍රඥාවන්ත මනුෂ්‍යයන් ක්‍රිස්තුස් වහන්සේ නැතිව සහාවේ නීති සම්පාදනය කිරීමට සහ ගැලවුම්කරුවාණන් නැතිව ගැලවීම ප්‍රකාශ කිරීමට බොහෝ වෙහෙස මහන්සි වී උත්සාහ දරන්නේය. නමුත් ඔවුන්ගේ ගොඩනැඟීම වියවුල් වී අසාර්ථක වුණා වූ බාබෙල් කොත මෙන් සහ සෙලවෙන්නාවූ වැටක් මෙන් වන්නේය. ක්‍රිස්තුස් වහන්සේ තුල ඇති පුද්ගලභාවය සුභාරංචියේ අභිරහස් ආශිර්වාදයේ කේන්ද්‍රස්ථානයයි. මැවුම්කාර දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුල මනුෂ්‍යයාගේ ස්වභාවය උන්වහන්සේගේ ස්වභාවයට පත් කරනු ලැබීම කොපමණ පුදුම සහගතද? දාවිත් මෙම පුදුම සහගත තත්ත්වය මහත් ශබ්දයකින් හඬ නගා කීවේය. ***"ඔබ මනුෂ්‍යයා සිහි කිරීමට ඔහු කවරෙක් ද, ඔබ මනුෂ්‍ය පුත්‍රයා සැලකීමට ඔහු කවරෙක්ද"*** (ගීතාවලිය 8:14)

ක්‍රිස්තුස් වහන්සේගේ මාංශවත් වීම

ක්‍රිස්තුස් වහන්සේ මාංශවත්ව උපත ලැබීම පිළිබඳව දෙවියන් වහන්සේගේ ප්‍රඥාව තුළ හට ගත්තා වූ සිතුවිල්ල සිතා ගැනීමටවත් නුපුළුවන. "එම්මානුවෙල්", "දෙවියන් වහන්සේ අප සමගයි" යන අදහස සර්වබලධාරී දෙවියන් වහන්සේගේ සර්ව ඥාණය තුළින් පැමිණෙන්නා වූ යෝජනාවක් වූ සේක. සර්වබලධාරී මැවුම්කාර දෙවියන් වහන්සේ බිළිඳකු ලෙස උපත ලබා අතීත දවස් වල දී දරුවකු ලෙස වර්ධනය වී මනුෂ්‍යයාගේ දුක සහ වේදනාව අත්විඳ එය සදාකාලික ආශිර්වාදයට හරවන ලැබූ සේක. ඒ ගැන සිතා බලන්න. මෙම අදහස නැවුම් අදහාගත නොහැකි මවිත වූ දිව්‍යමය එකකි. ක්‍රිස්තුස් වහන්සේගේ මාංශ පත්වීම තුළ දිව්‍යමය සහ මනුෂ්‍ය යන ස්වභාවයන් දෙකම පැවතුණු සේක.

සුභාරංචිය තුළ මෙම සත්‍යතාවයන් තදින් බැඳී පවතී. ඉහළින් පැමිණියා වූ පුත්‍රයාණන් වහන්සේ බෙත්ලෙහෙමේ උපත ලැබූ සේක. උන්වහන්සේ ධර්මිෂ්ඨ කමේ ක්‍රියාවන් කිරීමට සහ උන්වහන්සේගේ ලේ වැගිරීමට පෙර දේව දූතයන් මෙසේ ගායනා කළහ. ***"ඉතා උසස් තැන්හි දෙවියන් වහන්සේට මහිමය ද, පොළොවෙහි උන්වහන්සේට ප්‍රිය වූ මනුෂ්‍යයන් අතරෙහි සමාදානය ද, වේවයි කීසේක."*** (ලූක් 2:14) මක්නිසාද යේසුස් යේසුස්වහන්සේගේ මාංශ වත් වීම මනුෂ්‍යයාගේ කාරණා වලට ඉතා යහපත් බව ඔවුන් දැන සිටියෝය. ස්වාමීන් වහන්සේ මනුෂ්‍ය ස්වභාවය ගෙන පැමිණි විට එයින් අදහස් කරන්නේ එය මනුෂ්‍ය වර්ගයාට ඇදහිය නොහැකි (සිතා ගැනීමටවත් බැරි) ආශිර්වාදයක් බවයි. ***"මක්නිසාද, අපට ළදරුවෙක් උපන්නේ ය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේය"*** (යෙසායා 9:6) මෙම ළදරුවා සහ පුත්‍රයා අපගේ ගැලවීම බව අපි දකින්නෙමු. දෙවියන් වහන්සේ තුල අපගේ මෙම ස්වභාවය නිසා කිසිවක් නැති විටදී ද අපට ප්‍රීති විය හැකිය.

අපගේ ජාතිය තුල මෙම අනුග්‍රහයට කොපමණ ගෞරවයෙන් සලකනවාද? අනිත් මැවිලි පිළිබඳව ස්වාමීන් වහන්සේ ක්‍රියා කළේ කෙසේද? දෙවියන් වහන්සේ දේව දූතයන්ගේ ස්වභාවය නොව ආබ්‍රහම්ගේ බීජය (වංශය) තෝරාගත් බව අපි දනිමු. උන්වහන්සේ මනුෂ්‍ය ස්වභාවය ගෙන වාසය කළ සේක. සර්වබලධාරී දෙවියන් වහන්සේගේ දැත් වල ක්‍රියාව කරුණු කොටගෙන ක්‍රිස්තුස් වහන්සේ මෙලොවට පැමිණ මරණයේ වේදනාව විඳ දැන් තේජසේ සහ මහිමයෙන් ඔටුන්න පැළඳ ගෙන සිටින සේක. සැබැවින්ම මෙය සුභාරංචි යයි. මෙයින් පවුකරුවන්ට බලාපොරොත්තුවක් ඇති වන්නේ නැද්ද?

ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය තුළ දැන් ඔබගේ ජීවිතය ආලෝකමත් වේ. මෙයින් අදහස් කරන්නා වූ යහපත ඔබගේ ජීවිතයට අවශ්‍ය බව ඔබ තේරුම් ගන්නේ නැද්ද ? වචනය මාංශවත් වී මනුෂ්‍යයා අතරේ වාසය කිරීමෙන් ඔබගේ හදවතතුළ බලාපොරොත්තුව පිබිදෙන්නේ සහ ඒ අතරම ඔබව ගැලවීම වෙතට මෙහෙයවන බව විශ්වාස කරන්නෙ නැද්ද? නිශ්චිතවම දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතර පවතින්නාවූ එක්සත්කම නිසා මනසේ සියලුම කාරණා ආධ්‍යාත්මිකව පුනර්ජීවය ලැබීමෙන් අතිශය සතුටට පත් වන්නෝ ය. අපගේ ස්වාමීන් වහන්සේගේ පුද්ගලිකත්වය මේ දවස් වල දී (දැනුත්) ඒ ආකාරයෙන්ම පවතින සේක. මේ වන විටත් උන්වහන්සේ දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා වන සේක. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපගේ මාංශයෙන් මාංශ වත් වී, අපගේ ඇට සහිතව මාංශ වත්වූ නිසා අපගේ මනුෂ්‍ය ස්වභාවයන්ට සම්පූර්ණයෙන්ම අනුකම්පාව දැක්වීම ට දැක්වීමට හැකිව හැකි ව සිටින සේක. ඒ අතරම සීමාරහිතව අපට උපකාර කිරීමටත්, උන්වහන්සේ පියාණන් වහන්සේ සමඟ සිටින බව දැකීමට සැලැස්වීමටත් හැකි ව සිටින සේක. ජේසුස් වහන්සේගේ දිව්‍යමය ස්වභාවය ප්‍රකාශ කරනු ලැබූවත් උන්වහන්සේගේ මනුෂ්‍ය ස්වභාවයක් පවතින සේක. උන්වහන්සේ සැබවින්ම මනුෂ්‍ය ස්වභාවය ඇතිව සිටින නිසා උන්වහන්සේගේ දිව්‍යමය ස්වභාවය අහිමි වී නොමැත. එබැවින් අපගේ සැනසිල්ලේ උල්පත ගලායාම නවතින්නේ නැති නිසා මෙය අපට බලාපොරොත්තුවේ දොරටුවක් වී තිබේ.

ක්‍රිස්තුස් වහන්සේගේ මහිමාන්විත කාර්යය

අපගේ ස්වාමීන් වහන්සේ ගැන අපි සිතනවිට උන් වහන්සේ අප උදෙසා භාර ගත්තා වූ මහිමාන්විත කාර්ය භාර්යය සම්පූර්ණ කරන බව මතක තබාගන්න. යේසුස් වහන්සේ මනුෂ්‍යයෙකු වශයෙන් උන්වහන්සේගේ ජීවිතය යටත් කරමින් කුරුසයේ මරණය දක්වා කීකරු වූ සේක. උන්වහන්සේ මාංශ වත් වී වහලෙක් (සේවකයෙක්) මෙන් යටහත් වූ සේක. එබැවින් අපගේ සේවයේ දී අසාර්ථකවීම, මුදා ගැනීමේ අනෙකුත් කාර්යන්ට නොගැළපෙන ලෙස කටයුතු කිරීම සහ තමන් උදෙසා සේවය කිරීම සුදුසු නොවේ. සියල්ලේ උරුමක්කාරයා වන උන්වහන්සේ අපගේ සේවයේ දී අපට අවශ්‍ය සියලු දේ සපයා දෙන පිණිස උන් වහන්සේට අපිව සම්බන්ධ කරගෙන තිබෙන සේක. උන්වහන්සේගේ කාර්යභාරය කොපමණ දුෂ්කර ද ? කොපමණ යටහත්ව තිබෙනවාද ? කොපමණ බරපතලද? යේසුස් වහන්සේ නින්දාව අපහාසය වේදනාව දරාගෙන කුරුසයේ මරණය විඳිනු ලැබූ සේක. යේසුස් වහන්සේ බර කුරුසය සම්පූර්ණයෙන්ම උසුලාගෙන අපට උසුලා ගත නොහැකි වූ පියාණන් වහන්සේගේ ධර්මිෂ්ඨ කමේ උදහස අප වෙනුවෙන් උසුලා ගත් සේක. යේසුස් වහන්සේ අප වෙනුවෙන් නො කළා වූ වෙනත් දෙයක් තිබෙනවාද ? උන්වහන්සේ අපගේ පාපය මුහුදේ ගැඹුර ට හෙලා දැමූ සේක. යේසුස් වහන්සේ අපේ කුසලානය වියළෙන්නට හෝ බොර වීමට සදාකාලයටම ඉඩ නොහරින සේක. උන්වහන්සේ ව්‍යවස්ථාවෙ ශාපයෙන් අපව මුදා ගන්නා පිණිස අප වෙනුවට තමන් වහන්සේම පූජා වූ සේක. යේසුස් වහන්සේ ව්‍යවස්ථාව තුළින් පෙන්වා දෙන පාපයේ සීමාව අවසන් කර සදාකාලික ධර්මිෂ්ඨකම ගෙන එනු ලැබූ සේක. එමෙන්ම ව්‍යවස්ථාවෙ ප්‍රශ්න අයින් කර පියාණන් වහන්සේගේ සිංහාසනය වෙතට අපව ගෙන ඒමේ දිව්‍යමය පූජාව වූ සේක. අප යේසුස් වහන්සේව අනුගමනය කිරීම කරුණු කොටගෙන උන්වහන්සේ යම් තැනක සිටිනවා ද? අපිත් එතන උන්වහන්සේ සමග සිටින පිණිස අප සියලු කාරණාවලින් නිවැරදි තත්වයට ගෙන ඒමෙන් අපව ආරක්ෂා කරන සේක. ක්‍රිස්තුස් වහන්සේ පුද්ගලිකව අපගේ බලාපොරොත්තුව සඳහා අවශ්‍ය කාර්යයන් සම්පූර්ණ කර තිබෙන සේක. යේසුස් වහන්සේ නොමැතිව මට කිසිවක් කළ හැකි යැයි සිතීමට වත් නුපුළුවන. උන්වහන්සේ මගේ මුළු ගැලවීම සහ සම්පූර්ණ ආශාව වන සේක.

ක්‍රිස්තුස් වහන්සේගේ කරුණාව

ප්‍රිය සහෝදරයෙනි, අප සියලු දෙනාගේ සැනසිල්ල හටගන්නේ අපේ ස්වාමීන් වහන්සේගේ කරුණාව නිසාය. උන් වහන්සේ අනාගතවක්තෘ කෙනෙක්ද ? රජ

2 පිටුවට

1 පිටුවෙන්

ඔබ තුළ සිටින ක්‍රිස්තුස්...

කෙනෙක් ද ? උන්වහන්සේ මිත්‍රයෙක් ද ? උන්වහන්සේ සහෝදරයෙක්ද? උන්වහන්සේ හිසද? සෑම තැනකදීම සෑම කාර්යකදීම අපගේ ජීවිතයේ සියළු බර උන්වහන්සේ මත තැබීමට අපි ඉගෙනගත යුතුය. මක්නිසාද යේසුස් වහන්සේ අපගේ සියල්ලෙන් සියල්ල ව සිටින සේක. ඊට අමතරව උන්වහන්සේ අප වෙනුවෙන් පෙනී සිටින සේක. උන්වහන්සේ අපගේ ගිවිසුමේ (හිසව) ප්‍රධානියා ව සිටින සේක. අපගේ සදා කාලය උදෙසා මහත් ලෙස කටයුතු කරමින් සිටින සේක. පළමු ආදම් පාපයට වැටුණු නිසා අප සියලු දෙනාම (මුළු මනුෂ්‍ය සංහතියම) ඔහු සමඟ පාපයට වැටුණෝය. දැන් දෙවන ආදම් වන යේසුස් වහන්සේ උන්වහන්සේගේ ජීවිතය කරුණු කොටගෙන සියලු දෙනාවම උන්වහන්සේගේ සෙනඟ කරගෙන ඔවුන් උදෙසා සිට ගනිමින් ඔවුන් වෙනුවෙන් ගිවිසුම ආරක්ෂා කරන සේක. සියලු කාරණාවල දී මෙහෙයවමින්, සහතික කරමින් සහ සියලුම ආශීර්වාද නිරන්තරයෙන් ම ආරක්ෂා කිරීමට පටන් ගන්නා සේක. ගිවිසුමේ උරුමය ඇදහිලි වන්තයාට හිමිකර දෙන සේක. මක්නිසාද යේසුස් වහන්සේ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින සේක. එමෙන්ම ඇදහිලි වන්තයා ගේ උරුමය ඔවුන්ට ලබා දෙන සේක.

සියලු දේ වලදී ක්‍රිස්තුස් ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟ උන්වහන්සේ තුළ සිටිය යුතුය. ඔවුන් උන්වහන්සේ තුළ කුරුසයේ ඇණ ගසනු ලබා මරණයට පත් වී තැන්පත් කරනු ලබා තිබෙන අතර උන්වහන්සේ තුළ නැවත නැගිට වනු ලැබූවෝය. සදාකාල ජීවනය සඳහා යේසුස් ක්‍රිස්තුස් ක්‍රිස්තුස්වහන්සේ තුල දෙවියන් වහන්සේගේ මහිමාන්විත සිංහාසනයේ දකුණු පැත්තේ සිට වනු ලබන සේක. ***"ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ, ස්වර්ගීය වූ ස්ථානවල උන්වහන්සේ සමඟ අප හිඳ, වූ සේක "*** (එපීස 2:6) උන්වහන්සේ තුළ අපි දැන් සහ සදාකාලයටම, ***"නමන් වහන්සේගේ කැමැත්තේ ප්‍රසන්න කමේ හැටියට යේසුස් ක්‍රීස්තුස් වහන්සේ කරුණු කොටගෙන පුත්‍රයන් වීමට අප පෙර නියම කළ සේක. "*** (එපීස 1:6) මුළු සුභාරංචිය සාරය යැයි ම පවසමි. සූර්යයා නැතිව දවසක් නැතිවාක් මෙන් සහ වතුර නැතිව ගඟක් නැතුවාක් මෙන්, යේසුස් වහන්සේ නැතුව සුභාරංචියක් නොමැත. දෙවියන් වහන්සේගේ සුභාරංචියේ රහසේ සාරය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය.

උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේම වන සේක

උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ ම වන අතර වෙන කෙනෙක් නොමැත. ක්‍රිස්තුස් වහන්සේට අප වෙනුවෙන් උන්වහන්සේගේ ජීවිතය පූජා කිරීමට වඩා අපට ලබාදීමට වෙන දෙයක් තිබුණේ නැත. අපගේ මිතුරන් අපට උපකාර කරන්නාවූ අය, අප වෙනුවෙන් බොහෝ යහපත් දේ ලබා දෙනවා විය හැකිය. නමුත් කිස්තුස් වහන්සේ උන්වහන්සේගේ ජීවිතය දුන් සේක. උන්වහන්සේ නිකම්ම අපට ප්‍රඥාව, ධර්මිෂ්ඨකම, පවිත්‍රකම, මිදීම ලබා නොදුන් සේක. අපට මේ සියලු දේ ලබා දීම උදෙසා උන්වහන්සේ ජීවිතය පූජා කළ සේක. එබැවින් මෙතැන් පටන් උන් වහන්සේ නැතිව කිසිවක් කල නොහැක.

අපගේ ම ස්වභාවික හිස්කම අපට හැඟෙන විට, ක්‍රිස්තුස් වහන්සේ ගෙන් අපි වඩ වඩා පූර්ණ විය යුතුය. දෙවියන් වහන්සේව දැනගැනීමට අපි බොහෝ සෙයින් ආශා වන විට අප උන් වහන්සේ වඩා හොඳින් දැන ගන්නෙමු. පාවුල් තුමා කිතුණුවෙක් වී අවුරුදු ගණනාවකට පසුව පිලිප්පි සෙනඟට ලියන විට මෙසේ ලියනු ලැබීය. ***"මගේම ධර්මිෂ්ඨකම නොව, ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරුණ කොටගෙන, ඇදහිල්ල නිසා දෙවියන් වහන්සේගෙන් පැමිණෙන ධර්මිෂ්ඨ කම ඇතුව ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින පිණිසත්, යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීම ට පැමිණෙන ලෙස, උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලයත්, උන්වහන්සේගේ දුක් වල පංගුකාර කමත් දැනගන්නා පිණිස පිණිසත් ය."*** (පිලිප් 3:9-11) පාවුල් තුමා තවම ක්‍රිස්තුස් වහන්සේව දැනගෙන නැද්ද? ඔහු පවසන්නේ "ඔව්" සහ "නැහැ" යනුවෙනි. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය දැන සිටින්නේ ය. නමුත් සියලු දේ වඩා හොඳින් දැනගෙන සිටියේ නැත. ***"සියලු ගංගා මුහුදට යති. එත් මුහුද, පිරෙන්නේ නැත. ගංගා පිටත්ව එන තැනටම නැවත යති. "*** (දේශනාකාරයා 1:7) අපගේ ම ගෞරවය උදෙසා හෝ වෙන කෙනෙකුගේ ගෞරවය උදෙසා නොව යේසුස් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගෞරවය උදෙසා උන්වහන්සේගේ කරුනාවේ ප්‍රේමයේ ආශිර්වාද ගංගාව අප තුලට ගලා ඇවිත් අපව පුරවනු ලබන සේක. අපි ඊට බොහෝ ආශා විය යුතුය. අපගේ හදවත් වල ඇති ආශාව ක්‍රිස්තුස් වහන්සේ විය යුතුය.

ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ සිටීම මෙම අබිරහසේ අනර්ඝත්වය යි.

ඇදහිල්ල කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ වාසය කිරීම ප්‍රථමයෙන් එත්තු ගන්න. ක්‍රිස්තුස්වහන්සේ සිත තුළ වාසය කිරීම ඉතා අනර්ඝ ය. මෙහි අත්‍යවශ්‍ය කාරණය සහ සාර්ථකත්වය එයයි. ක්‍රිස්තුස් වහන්සේ මත සිටින විට ආරක්ෂිත බව සහ නිශ්චල තාවය ලබා දෙන සේක. උන්වහන්සේ ඔබගේ ජීවිතය තුළ නිවස තුළ වාසය කරන සේක. ප්‍රථමයෙන් ඇදහිල්ල කරුණු කොට ගෙන ක්‍රිස්තුස් වහන්සේව ඒත්තු ගන්න. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මනුෂ්‍යයා අනර්ඝ කාරණයක් නොවන්නේ ද ? ඊටත් වඩා අනර්ඝ වූ කාරණයක් මම ඔබට පවසන්නෙමි. ඔබ ඇදහිල්ල තුළ වර්ධනය වෙද්දී ක්‍රිස්තුස් වහන්සේ වෙතින් ඔබ ලබාගන්නා වූ බලය ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණු කොටගෙන ඔබගේ ජීවිතය පවතින්නේ ය. එම නිසා ඇදහිල්ල කරුණු කොටගෙන ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ වාසය කිරීමෙන් තේජසේ බලාපොරොත්තුව පැමිණෙන්නේය.

"ක්‍රිස්තුස් වහන්සේගේ සියලු බලය තුළ උන්වහන්සේ ව අත් දකින්න." මේ සඳහා ඉතා වටිනා ක්‍රියාව වන්නේ මනුෂ්‍යයාගේ සැලසුම් ඉවත්කර දමන තෙක් ජේසුස් වහන්සේගේ සපලත්වය ලබාගත නොහැකි බැවින් මනුෂ්‍ය සැලසුම් ඉවත් කර දැමීමයි. යම් කෙනෙක් උන්වහන්සේගේ ලේ වලින් පවිත්‍ර වීමට පටන් ගන්නා විට ඔහුගේ මනුෂ්‍ය ශක්තිය ප්‍රකාශ නොකර, අනිත් අයගේ සාක්ෂිය මත රඳා පවතින්නේ නැතිව, පැහැදිලි ක්‍රියාමාර්ග අවබෝධ කරගන්නේ ය. ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ වාසය කරන විට ඔබගේ පාපයෙන් නිදහස් වීමෙන් උන්වහන්සේ ඔබව ප්‍රේමයෙන් සහ ශුද්ධකාමින් පූර්ණ කරන සේක. ඔබගේ හදවත සැනසිල්ලෙන් සහ ස්වර්ගයේ අභිප්‍රායෙන් දල්වන සේක. ඊළඟට ඔබ ස්වාමීන් වහන්සේව දැනගන්නේ ය. ක්‍රිස්තුස් වහන්සේව පිළිගැනීම නිසා ක්‍රිස්තුස් ක්‍රිස්තුස් වහන්සේට අයිතිවීම, උන් වහන්සේව අත්දැකීම තුළ මේ ලෝකයට ඔබව වටිනා කෙනෙක් බවට පත්වේ.

"නවද, අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ රජකම් කරන්නේමු" ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ රාජකීයෙ කුට සුදුසු වචන තබන සේක. ක්‍රිස්තුස් වහන්සේ සියළු බලයන් අභියෝග සහජ හැකියාවන් ආශාවන් යෝජනාවන් සහ සියළු සිතුවිලි වලට ඉහලින් උන්වහන්සේගේ රාජ ආධිපත්‍ය පාවිච්චි කරමින් ඔබගේ සියලු හැසිරීම් උන්වහන්සේට යටත් කර දීමට පොලඹවන සේක. මෙහිදී දේව මහිමය ප්‍රකාශ වීමට ආරම්භ වී ස්වර්ගීය පොරොන්දුව ඉටු කරනු ලබන සේක. ජේසුස් වහන්සේගේ රාජකීයත්වය ඇත්තේ කොපමණ ශ්ෂ්ඨව තිබෙනවා ද? උන්වහන්සේ ගේ පාලනය යටතේ සැබැවින්ම අපගේ නිදහස පවතින්නේය.

"ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ සිටින විට උන්වහන්සේ ඔබව පූර්ණ කරන සේක." ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළට පැමිණ විට උන්වහන්සේ සම්පූර්ණයෙන්ම ඔබ තුළ වාසය කරන සේක. එය කොපමණ පුදුමසහගත ද? ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ ජීවිතය තුළ ගෞරවනීය වූ කාරණාවන් වගා කරන සේක. ඔබ තුළ අපිරිසිදු දේ උන්වහන්සේ දකින්නේ නම් ක්‍රම ක්‍රමයෙන් එම වල් පැලෑටි සහ විස සහිත ගස් මුලින් ම උදුරා දමන සේක. ඔබගේ සම්පූර්ණ ස්වභාවය උන් වහන්සේ ඔබ තුළ වාසය කිරීම බවට පත් කිරීමට ක්‍රියා කරන සේක. අපගේ හදවත් වල ස්වභාවය අවබෝධ කරගැනීමට දෙවියන් වහන්සේ උපකාර කරන සේක.

"ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ ස්වරූපය පෙනෙනතෙක් මනුෂයාව වෙනස් කරන සේක"

කලුපාට යකඩ කැබැල්ලක් ගින්දරට දමා ඒ ගින්දර තුළ තිබෙන තෙක් ගින්දර මෙන් දිස් වේ. ගින්දර තුළත් යකඩය තුළත් වෙනසක් නොමැති බව ඔබට හැඟෙන්නේ ය. ගින්දර සම්පූර්ණයෙන්ම යකඩය තුළ ව්‍යාප්තව පවතින්නේ ය.එයින් බොහෝ දේ නිර්මාණය කළ හැකිය.මෝසෙස් තමාගේ දෙපාවලින් වහන් ගලවා ඉවත් කිරීමට පෙර හරෙබ්හිදී ඇවිලෙන්නා වූ ගිනි පඳුර දුටුවේය. එය බොහෝ සෙයින් ඇවිලෙන විට පඳුර පෙනුනේ නැත. ගින්දර පමණක් විශාල ලෙස පෙනුණේ ය. ගිනි උදුනක ගිනිදැල්ල මෙන් දීප්තිමත් ඇවිලෙන වා දුටුවේ ය. පඳුර ගින්දර බවට හරවනු ලැබුවේය. ඒ ආකාරයෙන් ක්‍රිස්තුස් වහන්සේ අප තුළට පැමිණි විට අප ඉතා උසස් තත්වයට ගෙන එන සේක. පාවුල් තුමා මෙසේ පැවසුවේය. ***"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසයේ ඇණ ගසනු ලැබ සිටිමි. එසේ වී නමුත් මම ජීවත් වෙමි . නමුත් නවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත් වන සේක. නවද, මා දැන් මාංශයෙහි ජීවත් වන ජීවිතය, මට ප්‍රේම කළා වූ, මා උදෙසා තමන්ම පාවා දුන්නා වූ , දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි"*** (ගලාති 2 : 20) යේසුස් වහන්සේ අපව ආත්මිකව ශාරීරිකව මානසිකව සම්පූර්ණයෙන් මුදා ගනිමින් පවිත්‍ර කරමින් සියලු ස්වභාවයන් සම්පූර්ණ කරමින් අප තුළ වාසය කරන සේක.

ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ වාසය කරන සේක. මම එය පැහැදිලි කරන්නේ කෙසේද...? අපි උන්වහන්සේ සමඟ බද්ධ වී සිටින්නෙමු. අපි උන්වහන්සේට ඉඩ හැරිය යුතුය. උන්වහන්සේට බැඳී සිටිය යුතුය. උන්වහන්සේට මුදා වී (වෙන් කරනු) ලබා සිටිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ අප තුළට පැමිණි විට අපට සිදුවන්නේ කුමක්දැයි අපි දැන ගනු ලබන්නෙමු.

"ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ සිටීමින් බලය ඔබ තුළ පවතින බව අදහස් කරන්නේ ය" ශක්තිමත් මනුෂ්‍යයෙකුගේ දෑත් මත ඔහුගේ නිවස රැඳී තිබෙන්නේය. (ඔහුට වඩා බලවන්තයෙක් පැමිණෙන තෙක්) ඔහුට වඩා බලවන්තයෙක් පැමිණි විට පළමු සිටි තැනැත්තාව පහ කරනු ලබන්නේය . මෙම අදහස මතක තබා ගන්න. ක්‍රිස්තුස් වහන්සේ පැමිණෙන තෙක් අපට බලය නැතිව සිටින්නෙමු. දැන් ක්‍රිස්තුස් වහන්සේ අප තුළට පැමිණි විට සතුරා වන සාතන් සහා සාතන් ගේ බලය සමඟ සටන් කර ජයග්‍රහණය ලබා ගැනීමට අපට බලය ලබා දෙන සේක.

ක්‍රිස්තුස් වහන්සේ අප තුළ සිටින විට මනමාලයා අප සමඟ සිටින්නේය. එබැවින් අපට නිරාහාරව සිටීමට නුපුළුවන. රජතුමා අප සමඟ සිටින සේක. එබැවින් අපි සන්තෝෂ වන්නෙමු. ක්‍රිස්තුස් වහන්සේ අප තුළ සිටින නිසා අපි ඉක්මනින්ම ආශිර්වාදයට පැමිණෙන්නෙමු. උන්වහන්සේගේ මහිමාන්විත අභිමුඛත්වය පිළිගන්නෙමු. ක්‍රිස්තුස් වහන්සේ අප තුළ සිටින විට උන්වහන්සේ අපගේ පියස්ස යටට පැමිණීම කොපමණ පුදුම සහගතද? ***" ද්වාරයෙහි නොපගේ හිස් ඔසවව්. එසේය සදාකාලික ද්වාරයෙනි, හිස් ඔසවව්. තේජසේ රජ්ජුරුවෝ ඇතුල් වන සේක. මේ තේජසේ රජ්ජුරුවෝ කවුද? සේනාවල ස්වාමීන් වහන්සේය. තේජසේ රජ්ජුරුවෝ උන්වහන්සේය.*** (ගීතාවලිය 24:9-10) උන්වහන්සේ ඇතුළු වීමත් සමඟ ගෞරවයත් පැමිණෙන බව දකින්න. උන්වහන්සේ දෙපා තිබෙන ස්ථානය මහිමයෙන් පූර්ණ ව තිබෙන සේක. යේසුස් වහන්සේ ඔබගේ හදවතට පැමිණි විට උන්වහන්සේගේ මහිමය ගෞරවය සදාකාලික බව ස්වර්ගය බව සහ අනෙකුත් සියලුම දිව්‍යමය ස්වභාවයන් උන්වහන්සේ සමඟ ඔබ තුළට පැමිණෙන සේක.

ක්‍රිස්තුස් වහන්සේ මා තුළට පැමිණ මා තුළ වාසය කරන සේක්වා යැයි යම් කෙනෙක් බලාපොරොත්තු වන්නේ නම් යටහත් කරමින් පසුතැවිලි වෙන්න වූ සිතක් ඇතිව සිටිය යුතුය. (ගීතාවලිය 51 : 17) පවිත්‍ර වූ පසු දෙවියන් වහන්සේගේ භාජනයක් ලෙස ක්‍රිස්තුස් වහන්සේ වඩා පවිත්‍ර කරමින් ඔවුන් තුළ වාසය කරන සේක. ලෞකිකකම, උඩඟුකම ක්‍රිස්තුස් වහන්සේගේ වාසයට බාධා ඇති කරන්නේය. ක්‍රිස්තුස් වහන්සේව වඩා වැඩියෙන් සතුටු කිරීමට ඉගෙන ගන්න. ක්‍රිස්තුස් වහන්සේට වාසය කිරීම අවහිර කරන්නා වූ කාරණා තිබෙන විට උන්වහන්සේ වාසය කිරීමට ආශා නොවන සේක. උන්වහන්සේගේ වාසය කිරීමට පිපාසයෙන් සහ ආශාවෙන් අතිශය උනන්දුවෙන් සිටින උන් වහන්සේ නැතිව සතුටු නොවෙන අය තුළට උන්වහන්සේ පැමිණෙන සේක.

"....ඇදහිල්ලේ කතෘවරයාද, සම්පූර්ණකරන්නාද වූ, යේසුස් වහන්සේ දෙසම බලමින් අප ඉදිරියෙහි තබා තිබෙන දිවිම ඉවසිල්ලෙන් දුවමු." (හෙබ්‍රෙව් 12 : 1)

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ පවතින වගකීම් සහ උන්වහන්සේව සම්පූර්ණයෙන්ම විශ්වාස කිරීම

රිච් කාමිචෙල් විසිනි

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන් වහන්සේ අපට සහ අප තුළ කළා වූ සේවය මෙහිදී ඉලක්ක කර ගනිමු. අපගේ ගැලවුම්කාරවු සහ ජීවමානවු ස්වාමීන් වහන්සේ මහිමාන්විත ව, බලයෙන් පූර්ණව විශ්වාසවන්තව අනුකම්පාවෙන් පූර්ණ ව සිටින්නේ කෙසේදැයි කියා පෙරමඟ දූතයා පත්තරේ විවිධ වූ ලිපි වලින් ඉගෙන ගන්නා වූ කාරණා සැලකිල්ලෙන් යුතුව මතක තබා ගන්න. පහත සඳහන් සත්‍යතාවයන් තුළින් පෙන්වාදෙන ස්වාමීන් වහන්සේගේ සේවය, චරිත ගුණාංග, උන්වහන්සේගේ ස්වභාවය, උන්වහන්සේගේ පුද්ගලභාවය අපගේ හදවත් වල තබා ගැනීමෙන් අවසානය දක්වා ස්ථිර සිටීමට අපට මතක් කර දෙමින් උපකාර කරනු ලබනවා ඇත.

යේසුස් වහන්සේ පිළිබඳ සත්‍යතාවයන්

උන්වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ ය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය. (මතෙව් 16:16) උන් වහන්සේත් පියාණන් වහන්සේත් එක තැනැත්තා වන සේක. (යොහාන් 10:30) පියාණන් වහන්සේගෙන් ඇසූ සියල්ල අපට දැන් වූ සේක. (යොහාන් 15:15) උන්වහන්සේ පියාණන් වහන්සේගේ දකුණු පැත්තේ වැඩ හිඳින සේක. (කොලොස්සි 3:1) මාර්ගයත් සැබෑවත් ජීවනයත් උන්වහන්සේ වන අතර පියාණන් වහන්සේ වෙතට පැමිණීමට හැකි එකම මාර්ගය උන්වහන්සේ පමණක් වන සේක.
(යොහාන් 14:6)

ජේසුස් වහන්සේ ජීවනදායක කෑම වන සේක. (යොහාන් 6:35) සදාකාල ජීවනය පවතින්නාවූ කෑම උන්වහන්සේ අපිට ලබා දෙන සේක. (යොහාන් 6:27) උන්වහන්සේ ආත්මික පර්වතය වන සේක. (කොරියන්ති 10:4) කිසි කලෙකත් පිපාසා නොවෙන්නා වූ ජීවනදායක ජලය අපට ලබා දෙන සේක.
(යොහාන් 4:14)

උන්වහන්සේ දෙවියන් වහන්සේගේ බැටළු පැටවාණෝය. (යොහාන් 1:29)ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ලේ අනර්ඝ ව තිබෙන සේක. (1 ප්‍රේත්‍රුස් 1:19) උන්වහන්සේගේ ලේ කරුනු කොටගෙන ධර්මිෂ්ඨ කරනු ලබන සේක. (රෝම 5:9) මුදා ගනු ලබන සේක. (එපීස 1:7) උන්වහන්සේගේ ලේ වලින් පව් නසනු ලැබූ සේක. (රෝම 3:25) සමගි කරගනු ලැබූ සේක. (කොලොස්සි 1:19-20) අපගේ හෘදය ශාක්ෂිය පවිත්‍ර කරනු ලැබූ සේක. (හෙබ්‍රෙව් 9:14) ශුද්ධ කමට පමුණුවනු ලබන සේක. (හේබ්‍රෙව් 13 12) සියලු පාප වලින් අපව පවිත්‍ර කරනු ලබන සේක. (1 යොහාන් 1:7) අපගේ සියලු පාප වලින් අපව නිදහස් කරනු ලබන සේක. (එළිදරව් 1:15) උන්වහන්සේ අපගේ පාස්කු බැටළු පැටවාණෝය. (1 කොරින්ති 5:7) බොහෝ දෙනා උදෙසා පව්කමාව පිණිස උන්වහන්සේගේ ලේ වගුරුවනු ලැබූ සේක. (මතෙව් 26: 28)

යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ මහන්තත්වය ප්‍රභවය ද උන්වහන්සේගේ දේවත්වය ස්වරූපය ද වන සේක. (හෙබ්‍රෙව් 1:3) උන්වහන්සේ දෙවියන් වහන්සේගේ රූපකාය දරණ සේක. (පිලිප්පි 2:6) උන්වහන්සේ අදෘශ්‍යමාන දෙවියන් වහන්සේගේ ස්වරූපයයි. (කොලොස්සි 1:15) දෙවියන් වහන්සේගේ මුළු පූර්ණකම යේසුස් වහන්සේ තුළ වාසය කරන සේක. (කොලොස්සි 1:19) උන්වහන්සේ දෙවියන් වහන්සේ වන සේක. (යොහාන් 1:1)උන්වහන්සේ සියල්ලන්ට ම උතුම් වූ සදාකාල ආශිර්වාදලත් දෙවියන් වහන්සේය. (රෝම 9:5)

යේසුස් වහන්සේ ජීවනයේ අධිපතියා වන සේක. (ක්‍රියා 3:15) උන්වහන්සේ කරුණු කොටගෙන සහ උන්වහන්සේ උදෙසා සියල්ල මවනු ලැබූ සේක. (කොලොස්සි 1:16) උන්වහන්සේ තමන්ගේ බලපරාක්‍රමය වචනයෙන් සියල්ල දරා සිටින සේක. (හෙබ්‍රෙව් 1:3) උන්වහන්සේ සියල්ලටම පළමුවෙන් සිටින සේක. සියල්ල ද උන් වහන්සේ තුළ පවතින්නේ ය. (කොලොස්සි 1:17) යේසුස් වහන්සේ අල්ෆා සහ ඔමේගා ය. පළමුවැනියා සහ අන්තිමයා ය. පටන් ගැන්ම සහ කෙළවරය. (එළිදරව් 22 : 13) දෙවියන් වහන්සේ උන් වහන්සේව ඉතා උසස් කළ සේක. (පිලිප්පි 2:9) ඒ අතරම උන්වහන්සේ ළංව සිටින සේක. (පිලිප්පි 4:5) ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ උන්වහන්සේගේ සෙනඟ තුළ වාසය කරන සේක. (කොලොස්සි 1 :27)

යේසුස් වහන්සේ සැබෑ වූ මිදිවැල වන සේක. (යොහාන් 15:1) සදාකාල ගැලවීමේ කතෘ වන සේක. (හෙබ්‍රෙව් 5:10) අපව ධෛර්යමත් කිරීමේ උල්පත වන සේක. (2 තෙසලෝනික 2:16-17) බලාපොරොත්තුවේ උල්පත ද වන සේක. (1 තෙසලෝනික 1:2) උන්වහන්සේ ඉවසීමේ උල්පත වන සේක. (2 තෙසලෝනික 3:5) ධර්මිෂ්ඨකමේ උල්පත වන සේක. (පිලිප්පි 1:11) ප්‍රීතියේ බහුලත්වයේ උල්පත උන්වහන්සේ වන සේක. (පිලිප්පි 1:25) පූර්ණත්වයේ උල්පත වන සේක. (කොලොස්සි 2:10) දෙවියන් වහන්සේගේ තේජසේ සම්පතේ උල්පත ක්‍රිස්තුස් වහන්සේ ය. (පිලිප්පි 4: 19)මිදීමේ සහ සමාව දීමේ උල්පත උන් වහන්සේ වන සේක . (කොලොස්සි 1: 14)දෙවියන් වහන්සේ සමග සමාදානය සහ ප්‍රතිසන්ධානය ඇතිකිරීමේ උල්පත යේසුස් වහන්සේ වන සේක. (කොලොස්සි 1 : 20) උන්වහන්සේ පිරිසිදු කිරීමේ උල්පත වන සේක . (1 කොරියන්ති 1:2) වෙහෙස වෙන්නා වූ, බර උසුලන්නා වූ සියල්ලන්ට උන් වහන්සේ වෙතට ඇවිත් සහනය ලබා ලබාගැනීමට යේසුස් වහන්සේ ආරාධනය කරන සේක. (මතෙව් 11:28) උන්වහන්සේ සමග ප්‍රීතියෙන් පූර්ණ වූ සම්බන්ධතාවයකට උන්වහන්සේ ආරාධනා කරන සේක. (එළිදරව් 3:20)

යේසුස් වහන්සේ දාවිත්ගේ පුත්‍රයාණෝය. (මතෙව් 15:22) උන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයා වන සේක. (මතෙව් 16:27) පරීක්ෂා කරනු ලබන්නන්ට පිහිට වෙන්නට හැකි වූ දයාවන්ත වූ, විශ්වාස වූ උත්තම පූජකයාණෝය. (හේබ්‍රෙව් 2 :17-18) යේසුස් වහන්සේ උන් වහන්සේව ම යටත් කරගෙන අප වගේ මනුෂ්‍යයන්ගේ ස්වරූපයට පැමිණි සේක. (පිලිප්පි 2:7-8) උන්වහන්සේ අපේ දුර්වලකම් වල දී අපට අනුකම්පා කරන සේක. (හෙබ්‍රෙව් 4: 15)

ක්‍රිස්තුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ ගෘහය කෙරෙහි පත්ව සිටින පුත්‍රයකු මෙන් විශ්වාස ව සිටින සේක. (හෙබ්‍රෙව් 3:6) ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ අත්තිවාරම වන සේක. (1කොරියන්ති 3:11) අනර්ඝ වූ ජීවමාන ගල උන්වහන්සේය. (1 ප්‍රේත්‍රුස් 2:4) එමෙන් ම තෝරාගත් අනර්ඝ කොණේ ප්‍රධාන ගල උන්වහන්සේය. (1 පේත්‍රුස් 2 :16)

යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ වචනය වන සේක. (එළිදරව් 19:13)සදාකාල ජීවනය වචනය උන්වහන්සේට ඇත්තේය. (යොහාන් 6:68) උන්වහන්සේ ගුරුවරයාණෝය. (යොහාන් 3:2) එමෙන් ම උන්වහන්සේගේ වචන වල ආත්මයද ජීවනයද වෙයි. (යොහාන් 6:63) දෙවියන් වහන්සේගේ රහස වන ක්‍රිස්තුස් වහන්සේ තුළ තුල ප්‍රඥාවේ සහ දැනගැනීමේ සියලු වස්තු නිධාන කර තිබෙන සේක. (කොලොස්සි 2:2-3)

යේසුස් වහන්සේ කරුණාවෙන් සහ සත්‍යතාවයෙන් පූර්ණ ව සිටින සේක. (යොහාන් 1:14)

උන්වහන්සේගේ ඉවසීම සීමාරහිතව තිබෙන සේක. (1 තිමෝති 1:16) යේසුස් වහන්සේ සිතින් මෘදුව යටහත් ව සිටින සේක. (මතෙව් 11:29)උන්වහන්සේගේ ප්‍රේමයේ පළල, දිග, උස, ගැඹුර තේරුම් ගත යුතුය. (එපීස 3 :18 - 19) උන්වහන්සේ රෝගීව සිටින අය කෙරෙහි අනුකම්පාවෙන් ක්‍රියා කරන සේක. (මාක් 1:41) වේදනාවට පත්ව සිටින අය කෙරෙහි උන්වහන්සේ අනුකම්පා කළ සේක. (ලූක් 7-13)බඩගිනි ඇති අය කෙරෙහි උන්වහන්සේ අනුකම්පා කළ සේක. (මතෙව් 15:32) උපකාරයක් නැතිව හිරිහැර විඳිමින් සිටින අය කෙරෙහිත්(මතෙව් 9:36) පාපයට ගොදුරු වී නැති වී සිටින අය කෙරෙහිත් උන්වහන්සේ අනුකම්පා කළ සේක. (මතෙව් 9:13) උන්වහන්සේ ශුද්ධවූ ධර්මිෂ්ඨ වූ තැනැත්තා වහන්සේ වන සේක. (ක්‍රියා 3:14) උන්වහන්සේ විශ්වාස සහ සැබෑ වූ තැනැත්තා වහන්සේ ය. (එළිදරව් 19:11)

යේසුස් වහන්සේ ජීවනය අධික ලෙස ලබා දෙන සේක. (යොහාන් 10:10) උන්වහන්සේගේ ප්‍රීතිය අප තුළ පැවතියේ උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (යොහාන් 15:11) උන්වහන්සේ ශුද්ධාත්මයෙන් බෞතීස්ම කරන සේක. (මතෙව් 3:11) උන්වහන්සේ සියලු රෝග සුව කරන සේක. (මතෙව් 4:23) අපව නිදහස් කරන සේක. (යොහාන් 8:36) අපව ගළවා ගන්නා සේක. (ගලාති 1:4) උන්වහන්සේම අපේ දුර්වලකම් ගත් සේක. අපේ රෝග උසුලාගත් සේක. (මතෙව් 8-17) උන්වහන්සේ විශ්මපත් ලෙස ක්‍රියාකළ සේක. (මතෙව් 13-54) යේසුස් වහන්සේ දරුවන්ට ප්‍රේම කරමින් ආශීර්වාද කළ සේක. (මතෙව් 19-14) සමාදානය ලබා දෙන සේක. යොහාන් 14-27) අපව බලවත් කරන සේක. (පිලිප්පි 4 :13) අප තුළ බලවත් ලෙස ක්‍රියා කරන සේක. (කොලොස්සි 1:29) උන්වහන්සේ අපි වෙනුවෙන් මැදහත් කම් කරන සේක. (හෙබ්‍රෙව් 7:25) අපගේ විපාකය උරුමය අපට ලබා දෙන සේක. (කොලොස්සි 3:23)

යේසුස් වහන්සේ මනමාලයා වන සේක සේක. (මතෙව් 9: 15) උන්වහන්සේ අපට දුන්නා වූ මහිමය දකින පිණිස අපි උන්වහන්සේ සමග සිටීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (යොහාන් 17:24) යේසුස් වහන්සේ අපේ ආශිර්වාදලත් බලාපොරොත්තු වන සේක. (තීතස් 2:12) උන්වහන්සේගේ එම බලා බලාසිටින්නට ගැලවීම පිණිස නැවත පැමිණෙන සේක. (හේබ්‍රෙව් 9:28) උන්වහන්සේ පියාණන් වහන්සේගේ තේජසින් යුක්තව තමන් දූතයන් සමඟ නැවත එන සේක. (මතෙව් 16:27) උන්වහන්සේ වලාකුල් වලින් එන සේක. සියලු ඇස් ද උන්වහන්සේව දකින්නෝය. (එළිදරව් 1:7)

උන්වහන්සේගේ නාමය යේසුස්ය. මක්නිසාද තමන්ගෙ සෙනඟ ඔවුන්ගේ පාප වලින් ගලවන්නෙ උන්වහන්සේය. (මතෙව් 1-21) උන්වහන්සේගේ නාමය අන් සියලු නාම වලට වඩා උසස් ව තිබේ. (පිලිප්පි 2-9) වෙන කිසිදු නාමයකින් අපිට පාපයෙන් ගැලවීමට නුපුළුවන. (ක්‍රියා 4-12) උන්වහන්සේ ලෝකයාගේ ගැලවුම්කරුවාණෝය. (යොහාන් 4-42) කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන. (හේබ්‍රෙව් 7-25) නැති වූ දේ සොයන්නටත් ගලවන්ටත් උන්වහන්සේ ආ සේක. (ලූක් 19:10) උන්වහන්සේ පව්කාරයන්ව පසුතැවිලිවීමට කැඳවන සේක. (මතෙව් 9-13) යේසුස් වහන්සේ සේවය ලබන්නට නොව සේවය කරන්නට ද බොහෝ දෙනෙක් උදෙසා මිදීමේ මිලය කොට තමන්ගේ ජීවිතය දෙන්ටද ආ සේක.(මතෙව් 20- 28) අප

4 පිටුවට

" මා බලවත් කරන්නා වූ තැනැත්තේ වහන්සේ තුළ මට සියලු දේ කරන්නට පුළුවන." (පිලිප්පි 4:13)

3 පිටුවෙන්

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ...

පව්කාරයන්ව සිටියදීම ක්‍රිස්තුස් යේසුස් වහන්සේ අප උදෙසා මරණය විඳ්ද සේක. (රෝම 5-8) උන්වහන්සේ යහපත් බැටළු එඬේරා ය. බැටළුවන් උදෙසා උන්වහන්සේගේ ජීවිතය දුන් සේක. (යොහාන් 10 :14-15) ක්‍රිස්තුස් වහන්සේ අප උදෙසා ශාපයක් වී ව්‍යවස්ථාවේ සාපයෙන් අප මුදාගත් සේක . (ගලාති 3:13) උන්වහන්සේ දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතරේ මැදහත් කරුවාණෝය. (1 තිමෝති 2:5) අපව ආරක්ෂා කරන පිණිස පියාණන් වහන්සේ ඉදිරියෙහි අප උදෙසා මැදහත් කාරකම් කරන සේක. (1 යොහන් 2 :1)

යේසුස් වහන්සේ ලෝකයෙන් ජයගත් සේක. (යොහාන් 16 :33) අපට ජයග්‍රහණය ලැබෙන්නේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණු කොටගෙන වන සේක. (1 කොරින්ති 15:57) විශ්වාසය තුළ රැඳී සිටීමට උන්වහන්සේ අපව ධෛර්යමත් කරන සේක. (මාර්ක් 9: 23 , යොහාන් 16:33) භය නොවී සිටීමට අපව ධෛර්යමත් කරන සේක. (මාර්ක් 5;36) උන්වහන්සේ අපේ ඇදහිල්ලේ කතෘවරයා ද, සම්පූර්ණ කරන්නා ද වන සේක. (හෙබ්‍රෙව් 12:2) අන්තිමය දක්වා ස්ථිර ව සිටීමට අප ශක්තිමත් කරන සේක. (1 කොරියන්ති 1:8) උන්වහන්සේ අපේ එඬේරා සහ අපගේ ආත්මවල රැකවලා වන සේක. (1 ප්‍රේත්‍රුස් 2:25)

යේසුස් වහන්සේ කුරුසයේ මරණයට පත්වී තැන්පත් කරනු ලැබ, තුන්වෙනිදා මරණයෙන් උට්ඨාන වූ සේක. (1 කොරින්ති 15:3-4) උන්වහන්සේ ස්වර්ගයට ඔසවාගනු ලැබූ සේක. (ක්‍රියා 1:9) නැවත නැගිටීම ද, ජීවනය ද උන්වහන්සේ ය. (යොහාන් 11:25) යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැගිටීමේ කුළුදුලා වනසේක. (එළිදරව් 1:5)

යේසුස් වහන්සේ රජුන්ගේ රජතුමා සහ ස්වාමීන්ගේ ස්වාමි තුමා වන සේක. (එළිදරව් 19:16) උන්වහන්සේ පොළවේ රජුන්ගේ අධිපතියා වන සේක. (එළිදරව් 1:5) සියලු දේ පවා තමන්ට යටත් කරන්නට පුළුවන් වූ බලය ලෙස උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර තමන් වහන්සේගේ තේජසේ ශරීරයට සමාන වන පිණිස ඒවා වෙනස් කරනවා ඇත. (පිලිප්පි 3:21) මුළු මැවිල්ල කෙරෙහි ආධිපත්‍ය උන්වහන්සේට තිබේ. (මතෙව් 8:27) පාපයට සමාව දීමට ආධිපත්‍ය තිබෙන සේක. (මතෙව් 9:2) ස්වර්ගයේ ද, පොළවේ ද සියලු බලය උන්වහන්සේට තිබේ. (මතෙව් 28:18) සියලු දේ උන්වහන්සේගේ අත් වලට භාර දී තිබෙන සේක. (යොහාන් 3:35) සියලු මනුෂ්‍යයන්ගේ හිස උන්වහන්සේය. (1 කොරින්ති 11:3) උන්වහන්සේ සභාවේ හිස ද වන සේක. (එපීස 5:23) සියලු බලයේ ද, අධිපතිකමේ ද හිස උන්වහන්සේය. (කොලොස්සි 2:10) උන්වහන්සේ තමන් කෙරෙන් අධිපතීන් ද, බලය ලත්දන් ද පහ කරන සේක. (කොලොස්සි 2:15) යේසුස් වහන්සේ යක්ෂයාගේ ක්‍රියා විනාශ කළ සේක. (1 යොහාන් 3:8) උන්වහන්සේ මරණය නැති කර ජීවනයත්, අමරණීය භාවයත් එළිදරව් කළ සේක. (2 තිමෝති 1:10) ජේසුස් වහන්සේ, මළවුන්ගෙත්, ජීවතුන්ගෙත් ස්වාමීන් වහන්සේය. (රෝම 14:19) උන්වහන්සේ දෙවියන් වහන්සේගේ බලය සහ ප්‍රඥාව වන සේක. (1 කොරින්ති 1:24) යේසුස් වහන්සේ සියල්ලටම ප්‍රධානව සිටින සේක. (කොලොස්සි 1:18)

ක්‍රිස්තුස් වහන්සේට අපගේ ප්‍රතිචාරය

අපගේ ගැලවුම්කරුවාණන් වන ජේසුස් වහන්සේ කොපමණ අනර්ඝ ව සිටිනවා ද...? අපට සම්පූර්ණයෙන්ම උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය හැකිය. අපගේ වාතාවරණයන් සහ ජීවිත උන්වහන්සේට භාර දීමට හැකි වන ලෙස උන්වහන්සේ දයාවෙන් සහ විශ්වාසකමින් පූර්ණ ව සිටින සේක. උන් වහන්සේගේ බලයට සීමාවක් නොමැත. අප උදෙසා තිබෙන උන්වහන්සේගේ ප්‍රේමයට සීමාවක් නොමැත . උන්වහන්සේගේ හැකියාවට සීමාවක් නොමැත. අපගේ ජීවිත සම්පූර්ණයෙන්ම භාරදීමට සහ විශ්වාස තැබීමට හැකි වෙනත් ප්‍රේමණීය සහ තේජාන්විත ගැලවුම් කාරයෙක් සිටිනවාද...?

අපගේ ජීවිත සම්පූර්ණයෙන්ම කැප කිරීමට උන්වහන්සේ සුදුසු නැද්ද ප්‍රිය මිත්‍රවරුනි, අපි අපගේ සිතුවිලි පිළියෙල කර ගනිමු. අපේ දෑස් සහ අපගේ හදවත් ස්ථිර ලෙස උන්වහන්සේ මත රඳවා ගනිමු. අපගේ ජීවිත සම්පූර්ණයෙන් ම උන් වහන්සේට කැප කරමු. අවංකවම උන්වහන්සේට ප්‍රේම කරමු. (එපීස 6:24) උන්වහන්සේගේ පාමුල සිටීමට කාලය වැය කරමු. (ලූක් 10: 39) උන්වහන්සේට ඇහුම්කන් දෙමු. (මතෙව් 17:5) උන්වහන්සේ අනුව යමු. (මතෙව් 10:38) උන් වහන්සේට කීකරු වෙමු. (මතෙව් 28:20) උන්වහන්සේ තුළ තිබූ සිත (මනස) ඇති ව සිටිමු. (පිලිප්පි 2:5) යේසුස් වහන්සේ තුළහි පවතිමු. (යොහාන් 15: 5) ගෞරවනීය ලෙස උන්වහන්සේට බයෙන් යුක්තව සිටිමු.(එපීස 5:21) උන්වහන්සේට සේවය කරමු. (කොලොස්සි 3:24) ක්‍රිස්තුස් වහන්සේ උදෙසා දුක් දරා ගනිමු. (පිලිප්පි 1:29) උන් වහන්සේ ඉදිරියේ දණ නමමින් උන්වහන්සේට යටත් වෙමු. (පිලිප්පි 2:10) උන්වහන්සේ තුළ ස්ථිර ව සිටිමු. (පිලිප්පි 4:1) ස්වාමීවූ යේසුස්වහන්සේ තුළ නිතරම ප්‍රීති වෙමු. (පිලිප්පි 4:4) උන් වහන්සේ තුළ ස්ථිරව සිට (මුල් ඇද පිහිටා සිට) ගමන් කරමු. (කොලොස්සි 2:6) උන්වහන්සේගේ මෙහෙයෙහි වඩ වඩා පවතිමු. (1කොරින්ති 15:58) යේසුස් වහන්සේ ස්වර්ගයෙන් එනවා සිටිමු. (1 තෙසලෝනික 1:10) උන්වහන්සේ සමග ඒකඟත්වයක් ඇතිව සිටිමු. (රෝම 6:4-5) ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව පැළඳ ගනිමු. (රෝම 13:14) උන්වහන්සේ තුළ මුල් ඇද ගොඩනැගෙමු. (කොලොස්සි 2: 6) ක්‍රිස්තුස්වහන්සේගේ සාමදානයෙන් අපේ සිත් ආණ්ඩු කරනු ලැබේවා...! (කොලොස්සි 3: 15) උන්වහන්සේ වචනය අප තුළ සමෘද්ධ ව වාසය කෙරේවා! (කොලොස්සි 3:16) උන්වහන්සේ ගේ නාමයෙන් යාච්ඤා කරමු. (යොහාන් 14:13) අපි කරන්නා වූ සියලුම දේවල් ස්වාමිවූ යේසුස් වහන්සේගේ නාමයෙන් කරමු. (කොලොස්සි 3:17) ස්වාමීන් වහන්සේව ප්‍රසන්න කරමු. (කොලොස්සි 3:20) උන් වහන්සේ තුළ හැසිරෙමු. (ජීවත් වෙමු.) (කොලොස්සි 2:6) ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ජීවත් වෙමු (පිලිප්පි 1: 21)

යේසුස් වහන්සේ ප්‍රකාශ වුන විට විශ්මයට පත්වූවෝය.

දෙවියන් වහන්සේ හෝ යේසුස් වහන්සේ ප්‍රකාශ වූ විට සිදුවන්නේ කුමක්දැයි ලූක් 5:1-11 දක්වා පදවල අපි දකින්නෙමු.

"නවද, උන්වහන්සේ ගෙන්නෙසරෙත් නම් විල ළඟ සිටිය දී සනූහයෝ දෙවියන් වහන්සේගේ වචනය අසමින් උන්වහන්සේට තෙරපී ගෙන සිටියෝ ය. විල ළඟ ඔරු දෙකක් තිබෙනවා උන් වහන්සේ දුටු සේක. මසුන් අල්ලන්නෝ ඒවායින් බැස තමුන්ගේ දැල් සෝදමින් සිටියෝය. උන්වහන්සේ ඒ ඔරු වලින් එකක් වන සීමොන්ගේ ඔරුවට නැඟී ගොඩින් ටිකක් ඈත් කරන්ට ඔහුගෙන් ඉල්ලා ඔරුවෙහි වැඩ හිඳගෙන සනූහයන්ට ඉගැන්වූ සේක. උන් වහන්සේ කතා කොට නිම වූ කල ගැඹුරට ගොස් මසුන් අල්ලන්නට දැල් හෙළාපල්ලා යැයි සීමොන්ට කීසේක. සීමොන් උත්තර දෙමින්, ස්වාමීනි අපි මුළු රාත්‍රියේම වෙහෙසීමුව. නමුත් මොකවත් ඇල්ලුවේ නැත. එහෙත් ඔබගේ වචනය නිසා දැල් හෙලම් යි කීවේය. ඔවුන් එසේ කළ විට මසුන් මහත් රාශියක් අසුවිය. ඔවුන්ගේ දැල් ඉරෙන්නට පටන් ගත්තේය. ඇවිත් තමුන්ට උපකාර කරන්ට අනික් ඔරුවෙහි සිටි හවුල්කාරයන්ට ඔවුහු සංඥා කළෝය. ඔවුහු ආ කල්හි ගිලෙන තරමට ඔරු දෙකම පුරවා ගත්තෝය. සීමොන් ප්‍රේත්‍රුස් ඒ දැක යේසුස් ජේසුස් වහන්සේගේ දණ ළඟ වැටී, ස්වාමීනි මා වෙතින් ගිය මැනව. මම පවුකාර මනුෂ්‍යයෙක් යැයි කීවේය. මක්නිසාද, ඔහු සහ ඔහු සමඟ සිටි සියල්ලෝ තමුන් ඇල්ලූ මසුන් රාශිය දැක විස්මිත වූවෝය. සීමොන්ගේ හවුල්කාරයෝ වූ සෙබදීගේ පුත්‍ර වූ යාකොබ් ද , යොහාන්ද, එසේම විශ්මිත වූවෝය. යේසුස් වහන්සේ ...ඔය නොවන්න මෙතැන් පටන් නුඹ මනුෂ්‍යයන් අල්ලනවා ඇතැයි සීමොන්ට කීසේක. ඔව්හු තමුන්ගේ ඔරු ගොඩට ඇද, සියල්ල අත්හැර උන්වහන්සේ අනුව ගියෝය. (ලූක් 5:1-11)

මෙම බයිබල් ඡේදය කියවන විට ඉතා තදින් මගේ සිත ග්‍රහණය කරගත්තා වූ නවවචනයක් විය. ***"විශ්මිත වූවෝය "*** මම දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් ස්වාමීනි..., බයිබලයේ අපට පවසා තිබෙන පරිදි ඒ මොහොතේ ප්‍රේත්‍රුස්, යොහාන් සහ යාකෝබ් විස්මයට පත් වූයේ ඇයි කියා මට පහදා දෙන්නයි කීවෙමි. සේවයේ පිබිදීමක් ඇති වූ විට, අපට ඇති වන්නාක් මෙන් එහිදී ඔවුන්ටත් ඒ තීරණාත්මක මොහොතේ විශ්මිත වීමට විවිධ වූ කාරණා තිබෙන්නට ඇතැයි මම විශ්වාස කරමි. මෙම කාර්යය හරහා අපගේ ජාතිය සහ මුළු ලෝකය පුරා මහත් වූ ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීමක් පැතිර යාමට සලස්වන බව අපි අවබෝධ කරගත යුතුය .

විශ්මයට පත් වන්නා වූ ආකාරයට ක්‍රියා කිරීමට දෙවියන් වහන්සේට හැකිව තිබෙන සේක.

යේසුස් වහන්සේ ප්‍රකාශ වී ඔවුන්ට දැල් ගැඹුරට දමන්නැයි කියූ විට කොපමණ විශාල ප්‍රමාණයක් මාළුන්ව ප්‍රේත්‍රුස්, යොහාන්, යාකොබ් අල්ලා ගත්තා ද? මම ගණන් හදා බලද්දි ඒ කාලේ ගලීල මුහුදේ සාමාන්‍ය ප්‍රමාණයේ බෝට්ටු තිබූ අතර සාමාන්‍ය ප්‍රමාණයේම මාළු සිටින්නට ඇත. එම බෝට්ටු වල කොපමණ මසුන් සිටියා දැයි ක්‍රමානුකූලව සොයා බලමු. තුන්දාහක් පමණ මසුන්ගෙන් ඔරු පිරී තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකිය. යේසුස් වහන්සේ ප්‍රකාශ වී දෙවියන් වහන්සේගේ කාර්ය ඉටු කළ විට පේත්‍රුස් , යොහාන්, යාකොබ් කොපමණ විශ්මයට පත් වූවා දැයි මට සිතා ගැනීමට පුළුවන. වර්තමානයේ අපගේ ජාතිය තුළට ක්ෂණිකවම අස්වාභාවික ලෙස නිරායාසයෙන්ම සහ ශේෂ්ඨ ලෙස දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ පිබිදීම පැමිණ අපගේ ජාතිය වෙනස් වීමකින් අපි කොපමණ විශ්මයට පත් වන්නෙමු ද...? අපගේ දේශීය තුළ බොහෝ අවස්ථාවලදී දෙවියන් වහන්සේ විශ්මයට පත්වන දේ කර තිබෙන සේක.

විශ්මයට පත්වුණා වූ ස්ථානයේදී දෙවියන් වහන්සේට ක්‍රියාකළ හැකි ව සිටින සේක.

පේත්‍රුස්, යොහාන්, යාකොබ් ඔවුන්ව දෙවියන් වහන්සේගේ කාර්ය ඉටු කිරීමට තෝරා ගැනීම පිළිබඳව තවත් විශ්මයට පත් වන්නට ඇතැයි මම සිතමි. දෙවියන් වහන්සේ ඔවුන්ව ගලීල මුහුදු ළඟ සිට උන්වහන්සේට සේවය කිරීමට තෝරාගත් සේක. පේත්‍රුස්, යොහාන්, යාකොබ් වෘත්තීයෙන් ධීවරයන් වූ අතර , ඔවුන් ඒ සඳහා මහත්

5 පිටුවට

බයිරොන් පාවුලස් විසිනි.

4 පිටුවෙන්

යේසුස් වහන්සේ ප්‍රකාශ...

නිපුනතාවයක් ඇතිව සිටියෝ ය. ඒ අවස්ථාවේදී මහත් සෙනගක් මුහුදු වෙරලෙ සිටි බව පැහැදිලිය. යේසුස් වහන්සේ පැමිණ ඔබට මේ ආකාරයෙන් පැවසුවා නම් ඔබ කරන්නේ කුමක්දැයි කල්පනා කර බලන්න. මුළු රාත්‍රියේම ඔබ දැල් හෙලූවාක් මෙන් ගැඹුරට ගොස් දැල් හෙලන්න. ඉතා වෙහෙසට පත්වන තුරු ඔබ මහන්සි වුවත් එක මාළුවෙක් වත් අල්ලා ගන්නට නොහැකි වූ බව මම දනිමි. මාළුවන් නපුරු නැති බව ඔබ දන්නහු ය. යේසුස් වහන්සේ මට එලෙස පැවසු සේක් නම්, සමහරවිට මම ආකර්ෂණීය ලෙස ජේසුස් වහන්සේගේ පැත්තට ඇවිත් මෙසේ පවසනවා විය හැකිය. යේසුස් වහන්සේ ටිකක් නවතින්න මුහුදු වෙරළේ පිරී සිටින්නා වූ මේ මුළු සෙනඟ දෙස බලන්න. මේ සෙනග හෝ මම ඔබදෙස අයහපත් ලෙස බැලීමට සැලැස්වීමට මම ක්‍රියා නොකරමි. වෙනත් ගඟක් හෝ මුහුදක් මේ ප්‍රදේශයේ වෙනත් ස්ථානයක නොමැත. මාළු නපුරු වී සිටිනවා වීමට පුළුවන. එම නිසා මෙහි කිසිවක් සිදුනොවන බව මට සහතික වීමට පුළුවන.

මා මෙන්ම ඔබත් විවිධ හේතූන් දක්වන නිසා අපගේ අපගේ දේශයේ පාලකවරු සහ සෙනග අතරේ යම් කෙනෙක් පිබිදීම උදෙසා උද්‍යෝගිමත් ව සිටිනවා යැයි සිතිය නොහැකිය. පිබිදීම ගෙන ඒමට නිවැරදිම ස්ථානය මෙය නොවේ යැයි ඔවුන් සිතන්නේ ය. යම් තැනක විශාල සභාවකින් එය ආරම්භ විය යුතුය. එසේ නැතිනම් විශාල සම්මන්ත්‍රණයක දී යම් විශාල යාච්ඤා රැස්වීමකදී එය සිදුවිය යුතුය. මගේ මිතුරන් අතරේ හෝ මගේ සභාව තුළින් එය නිශ්චිතවම හටගන්නේ නැතැ යි සිතති.

අපගේ සංස්කෘතියේ ක්‍රියාමාර්ග තුළින් හෝ විශාල සභාවකින් හෝ හෝ ඊළඟ මහත් වූ පිබිදීම ඇති වීමට දෙවියන් වහන්සේගේ ආත්මය වගුරන්නේ නැතැයි මම සිතමි. දෙවියන් වහන්සේගේ ආධිපත්‍ය දෙවියන් වහන්සේගේ කැමැත්ත උන් වහන්සේව අවශ්‍ය කරන අය වෙතට ආත්මයාණන් වහන්සේගේ වැගිරීම ගෙන එනු ලබන සේක. එම නිසා සිදුවේ යැයි නොසිතන ස්ථානවල දෙවියන් වහන්සේගේ විශ්මිත වූ කාරණාවන් කරන බව මම විශ්වාස කරමි. ඊවන් රොබට්ස් සහ කුඩා කණ්ඩායම් යාච්ඤා කාමරයෙ සිට කළා වූ යාච්ඤා කිරීම කරුණු කොට ගෙන වේල්සයට පිබිදීම ගෙන ඒයැයි කියා සිතුවේ කවුද ? ජෙරුසෙලමේ උඩුමහල් මැදුරේ ගෝලයන් එක්ව කළා වූ යාච්ඤා කිරීම කරුණු කොටගෙන ඉතිහාසයේ මහත් වූ පිබිදීම පැමිණියේ යැයි සිතුවේ කවුද....? යොහාන් බෞතීස්ම වනාන්තරයේ සිට පැමිණ දෙවියන් වහන්සේගේ කාර්යය ඉටු කරනු ඇතැයි කියා සිතුවේ කවුද ? දෙවියන් වහනවහන්සේ උන්වහන්සේගේ මහත් වූ ක්‍රියා ඉටු කරන පිණිස මනුෂ්‍යයන් සිතුවාව් ස්ථාන තෝරා නොගත් සේක. ප්‍රසිද්ධ වූ මධ්‍යස්ථානයක් සහ සාර්ථකත්වය සඳහා කටයුතු කරන පුද්ගලයන් සිටින සංස්කෘතියවත් දෙවියන් වහන්සේගේ මහත් ක්‍රියාවන් ඉටු කිරීමට තෝරා නොගත් සේක. 1857 දී යෙරමියා ලැම්පියර් සහ තවත් මනුෂ්‍යයන් හයදෙනෙක්ගේ කණ්ඩායම තුළ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ මහත් වූ ක්‍රියාව ඉටු කිරීමට තෝරා ගත්තාක් මෙන් ක්‍රියාකරනසේක යි මම සිතමි. ඊට හේතු වන්නේ විශාල සභාවක් තුළ, ඔවුන්ගේ අභිප්‍රාය (චේතනාව) පවිත්‍ර වුවත් ඔවුන්ගෙන් විශාල පිරිසක් ඔවුන්ට කළ හැකි මොනවා දැයි සිතන්නෝය. දෙවියන් වහන්සේ උන් වහන්සේට කළ හැකිව තිබෙන්නා වූ දේ තහවුරු කර පෙන්වා දෙන සේක. මනුෂ්‍යයන් නොසිතන්නාවූ ස්ථානවලදී දෙවියන් වහන්සේ පිබිදීම හටගැනීමට සලස්වන සේක.

විස්මයට පත්වන්නා වූ දෙවියන් වහන්සේගේ වෙලාව

ගෝලයන් දෙවියන් වහන්සේගේ ක්‍රියාවේ ප්‍රමාණය සහ දෙවියන් වහන්සේ ක්‍රියා කළ ස්ථානය ගැන පමණක් නොව උන්වහන්සේ ක්‍රියා කළා වූ වෙලාව පිළිබඳව ද විශ්මයට පත් වූයේ යැයි මම සිතමි. එය කරදර සහිත වෙලාවකි. පේත්‍රැස් මුළු රාත්‍රියේම වෙහෙසට පත්ව සිටියේය. එය පීඩනකාරී අවස්ථාවකි. මක්නිසාද ඒ වන විටත් ඔවුන් දැල් සෝදමින් සිටියෝය. එම අවස්ථාවේ නැවත දැල් හෙලීමට සාධාරණ හේතුවක් තිබුණේ නැත. ඒ අවස්ථාවේදී ඉර උදා වී තිබුණු නිසා උණුසුම් තත්වය පැවැතීමෙන් වතුර රත්වන බැවින් සීතල සොයාගෙන දිවා භාගයේ මසුන් ජලයේ ගැඹුරට ගමන් කරති. එබැවින් තර්කානුකූලව දැල් හෙලීමට සුදුසු අවස්ථාවක් නොවීය. එම නිසා එම අවස්ථාවේදී මසුන් හසු වේ යැයි අපේක්ෂා කළ හැකි වෙලාවක් නොවේ.

අපගේ පිබිදීමේ සේවයේ යෙදී බොහෝ කරදරකාරී වාතාවරණයක් සහ සාධාරණ හේතුවක් නො පවතින ස්ථාන වලට ගමන් කිරීමෙන් දෙවියන් වහන්සේ මහත් බලවත් ලෙස ක්‍රියා කරන බව අපි දැක ඇත්තෙමු.

අවුරුදු කිහිපයකට පෙර දහසකට වඩා වැඩි සෙනගකට සුභාරංචි රැළියක් සඳහා දේවස්ථානයට පැමිණෙන ලෙස අපි ආරාධනා කළෙමු. දෙසැම්බර් මාසයේ පළමු සති දෙකම මෙම සුභාරංචි රැස්වීම පැවැත්වීමට ඔවුන් තීරණය කර තිබුණේය. මෙය අසාමාන්‍ය දෙයක් යැයි මම සිතුවෙමි. තැනින් තැනට සංක්‍රමණය වන්නා වූ සේවයකදී දෙසැම්බර් මාසයේ සති දෙකක් ඕනෑම ස්ථානයක සුභාරංචි රැස්වීමක් පැවැත්වීම පහසු නොවන බව ඕනෑම කෙනෙක් දැන සිටි. එම රැස්වීම සංවිධානය කළ අය මෙසේ පැවසීය . "අපි කැපවීමක් කරනවා දැකීම දෙවියන් වහන්සේට අවශ්‍ය තිබෙනවා යැයි අප විශ්වාස කරන්නෙමු " පූජා වීමට (කැප වීමට) උන්වහන්සේ ගෞරව කරන සේක. එම නිසා අවුරුද්දේ සැලැස්මේ දුෂ්කර අවස්ථාවක අපි සුභාරංචි රැලිය පැවැත් වීමට තෝරා ගෙන ඇත්තෙමු. "

සුභාරංචි රැස්වීම් මාලාවට පෙර විවිධ වූ අවස්ථාවලදී මම දේවස්ථානයට ගොස් දෙවියන් වහන්සේව සොයමින් යාඥාවෙන් මැදහත්කාරකම් කරන මෙන් ඇදහිලි වන්තයන්ගෙන් ඉල්ලා සිටියෙමි. සුභාරංචි රැස්වීමට සතියකට පෙර දේවස්ථානය තුල මධ්‍යම රාත්‍රිය දක්වා යාච්ඤා කිරීම සිදුවන බව යම් කෙනෙක් දුරකථනයෙන් මට කීවේය. මම එය තහවුරු කර ගැනීමට දේවස්ථානයට දුරකථන ඇමතුමක් දී එම තොරතුරු පිළිබඳව විමසා සිටියෙමි. අනිත් පැත්තේ සිට දුරකතනයෙන් කතා කළ පුද්ගලයා "ඔව්" එය එසේ සිදු වනවා යැයි තහවුරු කළේය. මගේ ඊළඟ ප්‍රශ්නය වූයේ තවත් කවුරුන් හෝ පැමිණියාද කියාය. දුරකථනයෙන් අනිත් පැත්තේ සිටි පුද්ගලයා මෙලෙස පිළිතුරු දුන්නේ ය. පාන්දර දෙක තුන වන තෙක් ස්ථාන රාශියක අඩු තරමින් දහ දෙනෙක් වත් රැස්වී යාච්ඤා කරනවා යැයි කීවේය. ගණන් කර බැලූ විට 150ක් 200 ක් අතර සෙනගක් විවිධ ස්ථානවල පාන්දර දෙක තුන දක්වා යාච්ඤාවේ යෙදී සිටියෝය. එම සුභාරංචි රැස්වීම තුළින් දෙවියන් වහන්සේ සෙනඟගේ ජීවිතවල අසාමාන්‍ය විස්මිත දේ කළ සේක.

විශ්මිත දේ දැකීමට දෙවියන් වහන්සේ සැලසුම් (උපක්‍රම) තෝරා තෝරාගෙන පාවිච්චි කරන සේක.

දෙවියන් වහන්සේ පාවිච්චි කිරීමට තෝරා ගත්තා වූ උපක්‍රමය ගැන ප්‍රේත්‍රැස්, යොහාන්, යාකොබ් විශ්මයට පත් වූවා යැයි මම විශ්වාස කරමි. උන්වහන්සේ පාවිච්චි කිරීමට තෝරා ගත්තා උපක්‍රමය කුමක්ද ? දෙවියන් වහන්සේ තිබුණා වූ එම ඔරුව ම එම දැල් ම භාවිත කළ සේක. උන්වහන්සේ පේත්‍රැස් ට කතා කරද්දි මෙලෙසින් පැවසුවේ නැත. පේත්‍රැස් ඊයේ රාත්‍රියේ නුබ කිසිවක් ඇල්ලුවෙ නැති බව මම දනිමි. නමුත් කරුණාකර ඔරුවේ පතුළ වෙනස් කිරීමට කාලය ගන්න. මාළුවන් කැමති වන සමහර දැල් අරගෙන වර්තමානයට ගැලපෙන ඇමක් ඊට සවි කරන්න." යේසුස් වහන්සේගේ ප්‍රකාශය තුළ එබඳු කිසිවක් තිබුණේ නැත.

මම උපක්‍රම පහත හෙලා කතා නොකරමි. නමුත් ජේසුස් වහන්සේ පැමිණි විට උපක්‍රම කුමක් වුවත් එහි ගැටළුවක් නැත. මේ වන විටත් අපි භාවිතා කරන උපක්‍රම පාවිච්චි කිරීමට උන්වහන්සේ කැමැත්තෙන් සිටින අතර ඔවුන්ට හැකියාව ලබා දී දෙවියන් වහන්සේට කරන්නට හැකිව තිබෙන දේ දැකීමට ඔවුන්ව පාවිච්චි කරන සේක. එසේ නොමැතිව අපගේ උපක්‍රම කෙරෙහි විශ්වාසය තබනවාට උන්වහන්සේ කැමති නොවන සේක.

විස්මයට පත් වන්නා වූ මනුෂ්‍යයන් ව තෝරාගෙන පාවිච්චි කරන සේක.

යේසුස් වහන්සේ ප්‍රකාශ වී දෙවියන් වහන්සේ පාවිච්චි කිරීමට තෝරා ගත්තා වූ මනුෂ්‍යයන් පිළිබඳව විශේෂයෙන් පේත්‍රැස් විශ්මිත වූවා යැයි මම සිතමි. පාවිච්චි කිරීමට යේසුස් වහන්සේ තෝරා ගනු ලැබුවේ කාවද? පේත්‍රැස් වෙහෙසට පත්ව සිටිය බව මතක තබා ගන්න. ඔබත් වෙහෙසට පත්ව සිටිනවා ද ? ඒ මොහොතේ දී ප්‍රේත්‍රැස් ට දැනී තිබුණේ අසාර්ථක වීමේ හැඟීමකි. ඔහුට කිසිම මාළුවෙකු අල්ලා ගැනීමට හැකි වූයේ නැත. ඔහු ධීවර කර්මාන්තය සඳහා වෘත්තීමය නිපුණතාවක් ඇති ව සිටි අයෙකි. ඔහු අත්හැර දමනු ලැබූ කෙනෙක් මෙන් ඔහුට හැඟුනේය. නමුත් යේසුස් වහන්සේ යම් දෙයක් දැක, යම් දෙයක් අවබෝධ කරගෙන සහ හැම විශ්මිත වූ කාර්යයට පාවිච්චි කිරීමට පේත්‍රැස් ව තෝරා ගත්තේ ඇයි කියා මම සිතමි.

එහි කාරණා තුනක් තිබේ. යේසුස් වහන්සේ ප්‍රේතැස්ව තෝරාගනු ලැබුවේ ඇයි කියා සැලකිල්ලෙන් යුතුව අවධානය යොමු කිරීමට මම ඔබව යොමු කරවන්නෙමි. වර්තමානයේ දී ද උන්වහන්සේ විශ්මිත වූ දේ කරන්නට යන විට මෙම කාරණා තුන දෙස යේසුස් වහන්සේ බලන සේක යි මම විශ්වාස කරමි.

පළමුවන කාරණය ප්‍රේත්‍රැස් අවංකව සිටියේය. මක්නිසාද ඔහු සිය කැමැත්තෙන්ම නිවැරදි තොරතුරු මෙසේ පැවසීය. "මුළු රාත්‍රියේම අපි වෙහෙස උනෙමු. නමුත් මොකවත් ඇල්ලුවේ නැත. "ධීවරයෙක් ලෙස ප්‍රේත්‍රැස් අවංකව සිටියේය. අවංකකම මේ ස්වභාවය උපරිමයෙන්ම තිබුණි. ඔහු තමාගේ සිත ස්වකැමැත්තෙන්ම විවෘත කළේය. දෙවියන් වහන්සේ මහත් දෙයක් කිරීම සඳහා අපව පාවිච්චි කිරීමට අපගේ සිත තුළ තිබිය යුතු පළමු පියවර අවංකකමයි.

දෙවනුව, යේසුස් වහන්සේ ප්‍රේත්‍රැස්ව තෝරා ගත් විට ඔහු යටත් වූවා යැයි මම සිතමි. ඔහු කීකරු වෙමින් යටහත් වූයේය. ප්‍රේත්‍රැස් කීවා වූ **"ස්වාමීනි..."එහෙත් "** යන මෙම වචන වලට මම ප්‍රේම කරමි. යේසුස් වහන්සේ ස්වාමීන් වහන්සේ ලෙස කතා කරද්දි උන්වහන්සේ ගුරුවරයා සහ ස්වාමියා වන සේක. ප්‍රේත්‍රැස්, යේසුස් වහන්සේ ස්වාමිත්වය ට සහ වචනය ආධිපත්‍යයට යටත් වූයේ ය.

තුන්වන කාරණය වන්නේ, ප්‍රේත්‍රැස්ගේ පුද්ගලිකත්වයයි. ස්වාමීනි ...යොහාන් සහ යාකොබ් වෙතට ගිය මැනවැයි ඔහු පැවසුවේ නැත . දෙවියන් වහන්සේ ඔබ විශ්මිත දේවලට පාවිච්චි කිරීමට නම් ඔබගේ ස්වභාවය පිළිගත යුතුය. "ස්වාමීනි මම පව්කාරයෙක්" කියා පවසන්න. මේ අනුව ඔබ අවංක වන විට කීකරුකම සහ යටහත්කම ඇතිවේ. පුද්ගලයෙක් වශයෙන් ඔබගේ ස්වභාවය අවබෝධ

" මා තුළ පැවතියල්ලා. මමත් නුඹලා තුළ පවතින්නෙමි." (යොහාන් 15:4)

මිදි වැලට සම්බන්ධ වී සිටින්න.

කිම් බට්ස් විසිනි

"මම සැබෑ වූ මිදිවැල ය. මගේ පියාණන් වහන්සේ ගොවියා ය. මා තුළ, එහි නිබී පල නොදරන සියලු වතු උන්වහන්සේ පහ කරන සේක. පල දරන සියලු වතු වඩා පර දරන පිණිස උන් වහන්සේ පවිත්‍ර කරන සේක. මා විසින් නුඹලාට කී වචනය කරුණු කොට ගෙන නුඹලා දැන් පවිත්‍ර ය. මා තුළ පැවතී යල්ලා. මමත් නුඹලා තුළ පවතින්නෙමි. අත්ත මිදි වලෙහි නොපවතී නම් තනියම පල දරන්නට බැරැව හක් මෙන් නුඹලා මා තුළ තුළ නොපවතී නම් පල දරන්නට නොබලා ට බැරිය. මිදි වැල මම ය. නුඹලා අතුය. යමෙක් මා තුළ එහි පවතින්නේ ද, මම ඔහු තුළෙහි තුළෙහි පවතිමිද, ඒ තැනැත්තේ බොහෝ පල දරයි. මක්නිසාද, මාගෙන් වෙන් ව කිසිවක් කරන්නට නුඹලාට බැරිය.යමෙක් මා තුළ නොපවතී නම්, ඔහු අත්තක් මේ පිටත දමනු ලැබ වියළී යයි. ඒවා එක්කොට ගින්නට දමනු ලැබේ. ඒව දාල යන්නේ ය. නුඹලා මා තුළ පවතින්නේ නම් මාගේ වචනය නුඹලා තුළ එහි පවතී නම් නුඹලා කැමති දෙයක් ඉල්ලා පල්ලා. එවිට නුඹලාට ලැබේ. මාගේ පියාණන් වහන්සේට ගෞරව ලැබෙන්නේ නුඹලා විසින් බොහෝ ඵල දරීමෙන් ය . මෙසේ නුඹලා මාගේ ගෝලයෝ වන්නේය. "
(යොහාන් 15:1-8)

දෙවියන් වහන්සේගේ කාර්යභාරය උන්වහන්සේගේ සෙනඟව උන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ ස්වරූපයට වෙනස් කර උන්වහන්සේ ගේ රාජ්‍යයේ සැලසුම් සහ අභිප්‍රායන් ඉටු කිරීමයි. ඉහත සඳහන් කර තිබෙන බයිබල් පද වලින් දෙවියන් වහන්සේ අපගේ ජීවිතවලට පවුල් වලට දයාවෙන් පූර්ණ වූ මෙම අභිප්‍රායට පංගුකාරයන් වීම සඳහා අවශ්‍ය දිව්‍යමය මගපෙන්වීම ලබා දී තිබෙන සේක. සමහර විට බොහෝ දෙනා දෙවියන් වහන්සේ දී ඇති නියෝග වලදී අපට කරන්නට එපා කියා ඇති වැදගත් නොවූ කාරණා සමඟ ප්‍රයෝගකාරී ව සම්බන්ධතාවයන් පවත්වති. බොහෝ ඇදහිලි වන්තයින් මෙම බයිබල් ඡේදය සමග ඉදිරියට යද්දී අපි උන්වහන්සේගේ මහිමය උදෙසා ඵල දැරීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන බව යෝජනා කර ඇතැයි සිතන්නෝ ය. කෙසේ වෙතත්, එහිදී තිබෙන්නා වූ නියෝගය **"මා තුළ පැවතියල්ලා"** යනුයි. මිදි වැලට අපි සම්බන්ධව සිටීමෙන් පමණක් මිදි අතු වන අපට ජීවය ලැබෙන්නේ ය. එලෙස අතු මිදි වැලට සම්බන්ධව තිබෙන විට ඵල හට ගන්නවා ඇත.

මගේම උත්සාහයෙන් සහ මගේම ශක්තියෙන් සටන් වදිමින් සෑම විටම හොඳ ඵල දරන්නේ කෙසේ දැයි කියා වටහා ගැනීම අපහසු ය. යහපත කිරීමට මම පොරබදන විට, මාගේ නිපුණත්වය ගැන උඩඟුකම ඇති කිරීමට සතුරා පරීක්ෂාව ගෙන එන්නේය. ඒ හේතුවෙන් දෙවියන් වහන්සේ මාව පාවිච්චි කිරීම අහිමි කර ගැනීමට මට අවශ්‍ය නොවේ. ඇදහිලි වන්තයින් ලෙස අපගේ ක්‍රියාවලින් සිතුවිලි වලින් සහ වචනවලින් යේසුස් වහන්සේව ප්‍රකාශ විය යුතුය. ඒ අතරම කීකරුකම තුළ පවතින්නාවූ පියාණන් වහන්සේගේ කැමැත්තට යටත් වෙන්නා වූ අත්තක් නොවී මෙය කළ නොහැකිය.

මිදි වත්ත අයිති ව තිබෙන්නේ කාටද?

යේසුස් වහන්සේ පැහැදිලි ලෙසම මෙසේ පැවසූ සේක. "මිදි වැල මමය. පියාණන් වහන්සේ ගොවියාය. " දෙවියන් වහන්සේගේ සෙනඟ වන අපි මිදි අතු වේ. යේසුස් වහන්සේ මිදි වැලේ කාර්යභාරය ලෙස උන්වහන්සේට සම්බන්ධව සිටින්නා වූ අතු වලට ජීවය ලබා දෙන සේක. දේව දරුවන්ට මිදිවැල මිදි වැලේ අතු සහ ගොවියා ගැන අවබෝධ කර ගැනීමට තවත් දෙයක් සංසන්දනය කිරීමට අවශ්‍ය නැත.මිදි වැලට සම්බන්ධ වී සිටින්නේ නම් කිතුනු ජීවිතයේ ඵලවලින් පිරුණාවූ ක්‍රියාමාර්ගවල පවතිනවා ඇත. සමහර තරුණ අය මිදි වැලෙන් වෙන්ව එක මොහොතක් හෝ ජීවත්වීමට උත්සාහ කරන නිසා පහසුවෙන්ම කළහැකි සමහර කාරණා ඉතා අසීරු තත්ත්වයකට පත් කරගෙන ඇත. අවාසනාවන්ත ලෙස බොහෝ දෙනා ක්‍රිස්තුස් වහන්සේගේ ජීවනයේ බහුලත්වය වෙතට හැරී ඒම තෝරාගෙන නැත.

වෙනස් කරගත යුත්තේ මොනවාද ? මව්පියන් ලෙස පැහැදිලිවම අපගේ දරුවන්ගේ ස්වභාවය ස්වාමීන්වහන්සේ තුළ ඉතා යහපත් කිරීමට ක්‍රියා කළ යුතුය. එමෙන්ම දරුවන් ඔවුන්ගේ විශ්වාසයන්ගෙන් කොන්දේසිවලින් ඈත්ව උපරිම වශයෙන් යේසුස්වහන්සේට සම්බන්ධ වී සිටිය යුතුය. ඒ අතරම දරුවන් ජීවිතය වෙනස් කර ගැනීමට අවශ්‍ය උපදෙස් පිළිගෙන ස්ථිරව සහ ධෛර්යමත්ව මිදි වැලට සම්බන්ධ වී සිටීම කරුණු කොටගෙන පියාණන් වහන්සේ වෙතට නැඹුරු විය යුතුය. එවිට බොහෝ ඵලවලින් පූර්ණ වූ ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබේ. දෙවියන් වහන්සේගෙන් වෙන් ව සිට දේව රාජ්‍යයේ පල දැරීමට නොහැකි බව අවබෝධ කර ගැනීම ඉතාම වැදගත් වේ. තමන්ගේම ප්‍රීතිය සහ තමන්ට වටිනා ලෙස පෙනෙන දේවල් මත රැඳෙන්නෙ නැතිව දෙවියන් වහන්සේගේ යහපත් අභිප්‍රායන් සහ සිතුවිලි අප තුළ තබන පිණිස කප්පාදු කිරීමට අවශ්‍ය දේ අවබෝධ කරගෙන පහසුවෙන් ඒ සඳහා ඉඩ හැරීමට ඉගෙන ගත යුතුය.

කප්පාදු කිරීමෙන් වඩා ඵල හටගන්නේ ය.

ඔබගේ පල දැරීම ඔබ හඳුනාගෙන තිබෙනවාද? ක්‍රිස්තුස් වහන්සේට සේවය කිරීම යනුවෙන් අදහස් කරන්නේ උන්වහන්සේ ගෙන් ඈත් වී අනිත් අය උදෙසා ජීවත් වීම නොවන බව අපගේ දරුවන් ඉගෙන ගත යුතුය. දෙමව්පියන් වශයෙන් ඔබ එවැනි ජීවිතයක් ගත නොකරන්න . එලෙස ජීවත් ජීවත්වන්නේ නම් දරුවන්ගෙන් නිවැරදි ජීවිතයක් අපේක්ෂා කල නොහැකිය. අපගේ ජීවිත යහපත් ඵල හටගන්නා වූ අත්තක් ද කියා හැමදාම සෝදිසි කර බැලිය යුතුය . එලෙස පල දැරීමට ශුද්ධවූ ජීවිතයක් ගත කරන්න. සභාවේ කාර්යයන් වලදී එක් ජීවිතයක් සහ නිවසේ දී ඊට වෙනස් වූ ජීවිතය ගත කරමින් තමාවම වංචා කර ගන්නා විට පියාණන් වහන්සේගේ ගෞරවය උදෙසා ඵල දැරිය නොහැකි ය.

යේසුස් වහන්සේ මෙලෙස ඉගැන්වූ සේක. **" එසේම සියලු හොඳ ගස් හොඳ පල දරයි. නමුත් නරක ගහ නරක පල දරයි. හොඳ ගහක නරක පල එත් නරක ගහක හොඳ එලවත් හට ගන්ට බැරිය. හොඳ පල නොදරන සියලු ගස් කපනු ලැබ ගින්නෙහි දමනු ලැබේ. එබැවින් ඔවුන්ගේ පලවලින් නුඹලා ඔවුන් අඳුනා ගන්නහුය."** (මතෙව් 7:17-20) **" මක්නිසාද, නරක පල දරන හොඳ ගහක් ගහක්වත් හොඳ පල ධර්ම නරක ගහක්වත් ඇත්තේ නැත. මක්නිසාද, එක එක ගහ එහිම ඵලයෙන් දැන ගනු ලැබේ. මනුෂ්‍යයෝ කටු ගස්වලින් අත්තික්කා ඵල නෙළා නොගනිති.ගොකටු පඳුරකින් මුදික පල කඩා නොගනිති. යහපත් මනුෂ්‍යයා තමාගේ සිතෙහි වූ යහපත් සම්පතෙන් යහපත් දේ, ද, නපුරු මනුෂ්‍යයා නපුරු සම්පතෙන් නපුරු දේ, ද, පිටතට ගෙන එන්නේය. මක්නිසාද, මුඛය කතා කරන්නේ සිතේ පූර්ණ කමෙන්ය.** (ලූක් 6:43-45)

ඔබගේ හදවතේ රැඳී තිබෙන්නේ මොනවාද...? ධර්මිෂ්ඨකමේ පල ඔබ තුළ පවතින නිසා ඔබගේ කටින් පිට වෙන්නා වූ වචනවලින් ජේසුස් වහන්සේගේ ශුද්ධකම ප්‍රකාශ වෙනවද...? ඔබ අනිත් අයව ධෛර්යමත් කරන්නෙක්ද? ඔබගේ වචන සහ ක්‍රියාවලින් ඔබ අනිත් අයට ආශිර්වාදයක් වී සිටිනවාද? ඔබගේ සිතුවිලි පවිත්‍ර ද? ඔබගේ වචන සහ ක්‍රියාවලින් දෙවියන් වහන්සේට ගෞරව පැමිණෙනවාද? ඔබගේ ගොවියා වන ඔබගේ ස්වාමීන් වහන්සේට කීකරු වීම කරුණු කොටගෙන ඔබගේ පවුලේ අයට, අසල්වැසියන්ට ඔබ වැඩ කරන ස්ථානය අයට මහත් බලපෑමක් ඇති කර තිබෙනවාද? පියාණන් වහන්සේගේ කප්පාදු කිරීම කරුණු කොටගෙන ඔබ මමත්වයට මැරී ඔබගේ ජීවිතයෙන් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ජීවත් වීමට හැකි වී තිබෙන බව ඒත්තු ගැනීමට පුලුවන්ද? දෙවියන් වහන්සේගේ රාජ්‍යය උදෙසා ජීවත් වීමෙන් ක්‍රිස්තුස් වහන්සේව ඔබගේ ජීවිතයෙන් ගලා යාමට ඉඩහැර තිබෙනවා ද මෙම ප්‍රශ්නවලට පිළිතුර "නැත" යන්න නම් ඔබ දෙවියන් වහන්සේගේ අපේක්ෂාව පලුදු කරතිබෙන අතර ඔබගේ සහ ඔබගේ පවුලේ අයගේ ජීවිතය ආත්මික අවදානමකට ලක් කර ඇත.

ක්‍රිස්තුස් වහන්සේගේ ස්වරූපයට පැමිණෙන්න.

"නමුත් ආත්මයාණන් වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත. " (ගලාති 5:22-23) ක්‍රිස්තුස් වහන්සේගේ වචනය හරහා ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ ජීවිත ජීවනදායක මිදි වැලට සම්බන්ධ වීමට පරිවර්තනය කරනු ලබන සේක. ආත්මයාණන් වහන්සේ කරුණු කොටගෙන අපව කප්පාදු කිරීම ඉවසා දරා සිටීමට හැකිවේ. එමෙන්ම ආත්මයාණන් වහන්සේගේ ශක්තිය සහ මඟ පෙන්වීම නිසා අප වටා සිටින්නාවූ අයගේ ජීවිත වලට වර්ධනය වුණා වූ ඵල ගෙන ඒමට හැකි ය. ක්‍රිස්තුස් වහන්සේගේ ජීවනදායක සාමදානයෙන් ඔවුන්ගේ ජීවිත ස්පර්ශ කිරීමට හැකි වේ. ශුද්ධාත්මයාණන් වහන්සේගේ පල ඔබ තුළ පවතින බව ප්‍රකාශ වීමට ඉඩ හරින්න. ආත්මයාණන් වහන්සේගේ පල දිනපතා ඔබගේ ජීවිතයේ ප්‍රකාශ වීමට ඔබ ඉඩ හරිනවද?

පියාණන් වහන්සේගේ කප්පාදු කිරීමේ ක්‍රියාවලියට අපි යටහත් වීම තුළ දේව රාජ්‍යයට ප්‍රයෝජනවත් වන්නා වූ ඵල දරා සිටීමෙන් අනෙකුත් සියලුම දේ පාලනය කිරීමට අපට බලය පවරා දෙන සේක. ක්‍රිස්තුස් වහන්සේගේ වචනය සහ ආත්මය ගැඹුරු ලෙස ඔබ තුළට පැමිණීමෙන් ඔබ උන්වහන්සේගේ ස්වරූපය ස්වරූපයට වෙනස් වෙනවා ඇත. ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ පවතින පිණිස දෙවියන් වහන්සේගේ මෙම මෙම ක්‍රියාකාරීත්වයට ඔබ ඉඩහැර තිබෙනවා ද...? ඔබගේ සිතුවිලි, හැඟීම් තෝරා ගැනීම, ඔබගේ ශරීරය, සමාජ සම්බන්ධතාවයන් සහ අනෙකුත් සියළුම ක්‍රියාකාරකම් ක්‍රිස්තුස් වහන්සේගේ මෙන් පවතිනවාද? ඔබගේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේ නැමැති මිදිවැල සහ ආලෝකයෙන් පූර්ණ ව පවතින පිණිස මෙම ප්‍රශ්න ඔබගෙන්ම අසන්න.

"ප්‍රේමය" :- ඔබගේ මුළු හෘදයෙන්, ආත්මයෙන්, බුද්ධියෙන්, ශක්තියෙන් ඔබගේ ස්වාමීන් වහන්සේට ප්‍රේම කරනවාද ? ඔබට මෙන් ඔබගේ අසල්වැසියාට ප්‍රේම කරනවාද ? (මාර්ක් 12:30-31)

"ප්‍රීතිය" :- ඔබ මුහුණ දෙන්නා වූ වාතාවරණයන් සැලකිල්ලට නොගෙන ප්‍රීති වීමට ඔබට හැකිද ? (1 තෙසලෝනික 5 :16)

"සමාදානය" :- මනුෂ්‍යයා ඥානයෙන් අවබෝධ කරගත නොහැකි සීමාරහිත සමාදානය ඔබ සමග තිබෙනවාද? (පිලිප් 4 : 7)

"ඉවසිලිවන්තකම" :- සියලු වාතාවරණයන් වල දී, එනම් දුක් පීඩාවල දී ඔබට ඉවසිලිවන්ත ව සිටීමට පුලුවන්ද ? (යාකොබ් 5:7-10)

"කරුණාවන්තකම" :- සමාව දීම

7 පිටුවට

6 පිටුවෙන්

මිදී වැලට සම්බන්ධ...

"කරුණාවන්තකම" :- සමාව දීම තුළින් කරුණාවන්තකම සහ අනුකම්පාව ඔබගේ ජීවිතයෙන් ප්‍රකාශ වෙනවද... ? (එපීස 4 : 32)

"යහපත්කම" :-ආලෝකයේ දරුවන් මෙන් යහපත්කමෙන්, ධර්මිෂ්ඨකමින් සහ සත්‍යයතාවයෙන් ඔබ පූර්ණව සිටිනවාද...? (එපීස 5 :8-9)

"විස්වාසවන්තකම" :- ඔබ සත්‍යතාවයට විශ්වාසවන්තව සිටිනවාද...? (3 යොහාන් 1:3)

"මෘදුකම" :- ඔබගේ ජීවිතයේ සියලු දවස් වලදි මනුෂ්‍යකමේ සාක්ෂිය ප්‍රකාශ වෙනවද (පිලිප්පි 4:5)

"පමණ දැන ක්‍රියා කිරීම" :- තමාව පාලනය කර ගැනීමට සහ පැහැදිලි මනසක් ඇතිව සිටීමට පුළුවන් වන පිණිස යාච්ඤා කරන්නට පුළුවන් වන්නේ කෙසේදැයි ඔබ ඉගෙන ගෙන තිබෙනවාද?
(1පේත්‍රුස් 1:7)

ඔබ මේ ඵල දරමින් ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වී සිටින්නේ නම් බොහෝ මනුෂ්‍යයන් දෙවියන් වහන්සේගේ මිදි වත්තට ඇදී එන්නෝය. ඔවුන්ටත් මිදිවැල වන ජේසුස් වහන්සේව අනුගමනය කිරීමට අවශ්‍ය වන්නේය. ඔබගේ ජීවිතයේ යහපත් ඵල හටගන්නා බව අවබෝධ කරගන්න. දුක් වේදනා විඳීමට සිදුවන අවස්ථාවලදී වුවත් මිදි වැලට සම්බන්ධ වී සිටීමේ මිලය ගෙවීමට ඔබ කැමතිද ? මෙය එතරම් පහසු කාර්යයක් නොවේ. බොහෝ දෙනා ඔවුන්ගේම මාර්ගය තෝරා ගනිති.

"පියාණෙනි ඔබ කැමැති සේක් නම්, මේ කුසලාන මාගෙන් පහකළ මැනව. එසේ වී නමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේ වේවයි කීසේක". (ලූක් 22:42)

යහපත් ඵල වෙනුවෙන් යාඥා කරන්න

දෙවියන් වහන්සේගේ කැමැත්ත අපි යහපත් ඵල දැරීමයි. එය දේව වචනයේ ස්ථිර ලෙස තහවුරු කර තිබෙන සේක. අවසානය දක්වා ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටීමට ශක්තිය ලබා ගැනීම සඳහා යාච්ඤා කිරීම අවශ්‍යව තිබෙන්නේ ය. දෙවියන් වහන්සේගේ ඵලවලින් පූර්ණ වූ අරමුණු උදෙසා යෝග්‍ය වන්නා වූ බලවත් වූ සමහර යාච්ඤාවන් අපෝස්තුලු පවුල් අපට ලබා දී තිබේ . ඔබගේ පවුලේ අය සමග එක්ව යාඥා කරන්න.

"යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණු කොටගෙන දෙවියන් වහන්සේට ගෞරවය හා ප්‍රශංසාව සඳහා නුඹලා ධර්මිෂ්ඨකමේ ඵල වලින් පූර්ණව, උතුම් වූ දේවල් ඒත්තු ගන්ට නුඹලාට පුළුවන් වෙන්නටත්, ක්‍රිස්තුස් වහන්සේගේ දවස දක්වා අවංකව නිදොස් ව සිටින්නටත්, නුඹලාගේ ප්‍රේමය දැන ගැන්මෙන් හා සියලු ආකාර විමසීමෙන් තව වඩා වඩා බොහෝ වන පිණිස යාච්ඤා කරමි". (පිලිප්පි 1:9-11)

"එබැවින් අපිත් ඒ දැක්ම දා පටන් උඹලා උදෙසා නොකඩවාම යාච්ඤා කරමින් නුඹලා සියලු ආකාර ප්‍රඥාව ද, ආත්මික නුවණද, ලබන ලෙස උන්වහන්සේගේ කැමැත්ත දැන ගැනීමෙන් පූර්ණ වී සියළු යහපත් ක්‍රියාවලින් පල දරමින් ද, දෙවියන් වහන්සේ දැන ගැනීමෙහි වර්ධනය වෙමින් ද, ප්‍රීතිය ඇතුළු සියලු ආකාර ස්ථිරකමටත් ඉවසිලිවන්ත කමටත්, උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලු ආකාර බලයෙන් ශක්තිමත් වෙමින් ද, ආලෝකයේ සිටින ශුද්ධවන්තයන්ගේ උරුමයෙන් කොටසකට අප සුදුසුකම් කළා වූ පියාණන් වහන්සේට ස්තුති කරමින් ද, නුඹලා ස්වාමීන් වහන්සේට ඔබින ලෙස සියලු ආකාරයෙන් ප්‍රසන්න ව හැසිරෙන ලෙස ඉල්ලමුව." (කොලොස්සි 1 :9-12)
මිදි වලට සම්බන්ධ වී සිටින්න. ඔබගේ යාච්ඤා කිරීමේ ගුණාංගවලට සිදුවන්නේ කුමක්දැයි දකින්න. දෙවියන් වහන්සේගේ අරමුණ උදෙසා ඔබගේ ජීවිතයේ ගුණාංග වඩා ප්‍රේමණීය ආකාරයට ස්වාමීන් වහන්සේ වෙනස් කරන්නාවූ ආකාරය අත් දකින්න.

ක්‍රිස්තුස් වහන්සේ අපගේ ගුරුවරයා සහ අපගේ මැදහත් කරුවාණන් වන සේක.

ඇන්ඩ්‍රෑ මරේ විසිනි.

ක්‍රිස්තුස් වහන්සේ අපගේ ගුරුවරයාණෝය.

ක්‍රිස්තුස් වහන්සේ ඉගැන්වූයේ මොනවාද උන්වහන්සේගේ සියලුම ඉගෙනීම් වලදී වල දී උන්වහන්සේ ජීවත්වන්නේ සහ උන්වහන්සේ මෙන් අපි ජීවත් විය යුතු වන්නේ කෙසේද කියා එළිදරව් කළ සේක. ජේසුස් වහන්සේ යාච්ඤා කළ ආකාරය උන්වහන්සේගේ සියලු ඉගැන්වීම් උන්වහන්සේගේ ජීවිතය පූජා කළ ස්වභාවය අපි ඉතා ශක්තිමත් ලෙස විශ්වාස කරන්නෙමු. යේසුස් වහන්සේ පැමිණියේ ව්‍යවස්ථාව සම්පූර්ණ කිරීමට වන සේක. උන් වහන්සේගේ ඉගැන්වීම් තුළ දී සුභාරංචිය සම්පූර්ණ කරන්නේ කෙසේද කියා ඉගැන්වූ සේක යාච්ඤා කළ යුතු කොහොමද සහ කුමක් වෙනුවෙන් ද කියත් ඉගැන්වූ සේක.

යාච්ඤා කිරීම යනු කුමක්ද ?

සමහර අවස්ථාවල දී යේසුස් යේසුස්වහන්සේට පියාණන් වහන්සේ සමඟ තිබූ සම්බන්ධතාවය සඳහා එය පුහුණු වීමට පැහැදිලිව ඉල්ලා සිටින සේක . එසේ වුවත් යාච්ඤා කිරීම පිළිබඳව ඉල්ලා සිටීම ඊට දෙවැනි වන්නේ නැත. සමහර අය ඉතා හොඳින් යාඥා කරන නමුත් ඒ රඳා සිටීමට ලබාදී ඇත්තේ ගණන් නොගත යුතු තරමේ ස්ථානයකි. අපි අපගේ ස්වාමිවූ යේසුස් වහන්සේ යාච්ඤා කිරීම පිළිබඳව ඉගැන් වූ කාරණා ඉතා සැලකිල්ලෙන් යුතුව අධ්‍යයනය කරන්නේ නම් උන්වහන්සේගේ ඉගැන්වීම එය නොවන බව දකිනවා ඇත ස්වාමින්වහන්සේගේ යාඥාවේ දී යාච්ඤාව පිළිබඳ උපමා වලදී දරුවෙක් රොටියක් ඉල්ලීමේදී, සෙවීමේදී, තට්ටු කිරීමේදී ඇදහිල්ලෙන් යාඥා කිරීමේ ප්‍රධාන සිතුවිල්ල තුළ සෑම විටම අපගේ ස්වාමීන් වහන්සේ උද්යෝගයෙන් යුතුව ඇයද සිටීමට අපව ධෛර්යමත් කරමින් පොලඹවන සේක.ස්ථිර වශයෙන්ම එම යාච්ඤාව පිළිගෙන පිළිතුරු ලබා දෙන සේක. බොහෝ සෙයින් අපගේ පුද්ගලික අවශ්‍යතාවයන් උදෙසා පමණක් යාච්ඤා කිරීමට සීමා වී තිබෙන ආත්මාර්ථකාමී අවශ්‍යතාවයන් ගෙන පූර්ණ සිතුවිලි වලින් නිදහස් වී ආයාචනා කළ යුතුය.

අපගේ මැදහත්කාරකම් කිරීම තුළ පමණක් මනුෂ්‍යයන්ට සැබෑ ආශිර්වාදය බලය අත් දකින්නට ලැබේ. මෙහිදී දෙවියන් වහන්සේ සමඟ සැබෑ සම්බන්ධතාවය පවත්වා ගන්නේ නැතිනම් අපගේ මොරගැසීම ට ස්ථිර ලෙස පිළිතුරු ලබාගෙන දෙවියන් වහන්සේගේ කරුණාව මනුෂ්‍යයන්ගේ ජීවිත වලට ගෙන එන්නාවූ මාධ්‍ය වීමට නුපුළුවන. පුත්‍රයාණන් වහන්සේ තුළ තිබෙන්නා වූ උන්වහන්සේගේ මැදහත් කාරකම් කිරීම මෙන් පියාණන් වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය තිබිය යුතුය.

ඇදහිල්ලෙන් යාඥා කරන්න

යාච්ඤා කරද්දි රහසිගතව යාච්ඤා කිරීමටත්, පරිසිවරුන් මෙන් බොහෝ වචන කියාගෙන කියාගෙන නොගොස් දෙවියන් වහන්සේ ඉදිරියේ තනිවී යටහත්ව ආත්මයෙන් සමාව දීමේ ප්‍රේමය තුළ සිට යාච්ඤා කරන්නයි අපගේ ස්වාමීන් වහන්සේ ඉගැන්වූ සේක. නමුත් උන්වහන්සේ ඇදහිල්ලෙන් යාඥා කරන්නැයි නැවත ඉගැන්වූ සේක. ඇදහිල්ල නොමැතිව දෙවියන් වහන්සේගේ බලය හෝ යහපත් කමක් ගැන විශ්වාසය තැබිය නොහැකි බවත් අපි ඉල්ලන්න වූ සියලු දේ ලබා ගැනීම සඳහා ස්ථිර සහතිකයක් ඇති ව සිටීමට නොහැකි බවත් පැහැදිලිවම විස්තර කරනු ලැබූ සේක.

පිළිතුරු ප්‍රමාද වෙනවා මෙන් පෙණුන විට පසුබට නොවී උත්සාහයෙන් සහා තදින ආයාචනා කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කළ සේක. උන්වහන්සේගේ අනුගාමිකයන් ලෙස අපිත් මෙලෙස ක්‍රියා කළ යුතුය. ***"ඒ වනාහී නුඹලා අලස නොවී ඇදහිල්ල ද, ඉවසිලිවන්ත කමද, කරුණු කොටගෙන පොරොන්දූ උරුම කරගෙන සිටින්නන්ගේ අඩි පාරේ යන්නන් වෙන පිණිසය ."*** (හෙබ්‍රෙව් 6:12)
ඔවුන් මෙම ඇදහිල්ල කරුණු කොටගෙන පොරොන්දුව ඒත්තු ගෙන ඉල්ලා සිටින්නේ මොනවාදැයි අවබෝධය ඇතිව සිටිති. මෙම ඉවසීම කරුණු කොටගෙන පොරොන්දුව සහ ආශීර්වාදය හිමිකර ගන්නෝය. ඊළඟට දෙවියන් වහන්සේගේ පොරොන්දුව ප්‍රතිවිපාක හිමි කර දෙන්නේ ය ඇයි කියා අපි අවබෝධ කර ගන්නෙමු. (ලූක් 18:8) මක්නිසාද ප්‍රමාද වෙනවා යැයි පෙනෙන විටත් ඔවුන් එහි රැඳී සිටියේය. ඇදහිල්ල කරුණු කරණ-කොටගෙන ඔවුන්ගේ මාංසයේ පරීක්ෂාවෙන් පවිත්‍ර කරනු ලබන අතර සියලු දේ කිරීමටත් කන්දක් වුවත් මුහුදේ පතුලට හෙළීමටත් ආත්මික බලය ශක්තිය ලබා ගන්නෝය. (මාර්ක් 11:23)

ක්‍රිස්තුස් වහන්සේ අපගේ මැදහත් කරුවාණෝය.

පියාණන් වහන්සේ සමඟ ක්‍රිස්තුස් වහන්සේට ඇති උසස් වූ සම්බන්දතාවයත් ලෝකය පාලනය කිරීමේදී උන්වහන්සේගේ ඇති පංගුකාර කමත් තුළ දෙවියන් වහන්සේගේ සිංහාසනය මත සිටිමින් මැදහත් කාරකම් කරන සේක. ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත් කාරකම් තුළින් දෙවියන් වහන්සේගෙන් අප වෙතට ඉහළින් පැමිණෙන්නාවූ සියලු ආකාරයේ ආශිර්වාද මුද්‍රා කර තබන සේක. යේසුස් වහන්සේ මනුෂ්‍යයා උදෙසා දෙවියන් වහන්සේට උන්වහන්සේගේ ජීවිතය පූජා කළ විට උන් වහන්සේ මුළු හදවතින්ම එක් කාරණයක් තහවුරු කළ සේක. එනම් මනුෂ්‍යයන්ගේ ගැලවීම තුළ දෙවියන් වහන්සේගේ මහිමයයි . එමෙන් ම උන්වහන්සේගේ මැදහත් කාර කමය මහත් වූ අභිප්‍රාය අවබෝධ කර දී තිබේ. යේසුස් වහන්සේ පියාණන් වහන්සේ ද මහිමයට පැමිණ වීම කරුණු කොටගෙන ඉල්ලන්නා වූ සියලු දේ පියාණන් වහන්සේ ගෙන් ලබාගන්නා සේක. පියාණන් වහන්සේ පවරාදී තිබෙන්නා වූ ආධිපත්‍යය කරුණු කොටගෙන මනුෂ්‍යයාව ගළවාගෙන තිබෙන සේක.

දැන් ක්‍රිස්තුස් වහන්සේ අපගේ ජීවිතවල මැදහත් කරුවාණන් වී සිටින සේක. උන්වහන්සේ අපගේ හිස සහ අපි උන්වහන්සේගේ ශරීරය වන්නෙමු.

8 පිටුවට

Reg. No: QD/111/පුවත්/2021
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

7 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේ අපගේ...

උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ජීවනදායක හුස්ම අප තුළ තබා තිබෙන සේක. මැදහත් කාරකම් කිරීමෙන් දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ගෙන ඒමේ මාධ්‍ය ලෙස උන්වහන්සේ ක්‍රියා කරන සේක. මැදහත් කාරකම් කිරීමෙන් අපි දෙවියන් වහන්සේව මහිමයට පත් කරන්නෙමු. ලෝකයට සහ සභාවට ඒ තුළින් අපි ආශිර්වාදය ගෙන එන්නෙමු. මනුෂ්‍යයන් ව මුදා ගැනීමට හැකි වූ ඉහළින් පැමිණෙන්නාවූ රාජකීය වූ ආශිර්වාදය හිමි කරගෙන ඇත්තෙමු .

පාවුල් තුමා මෙසේ ලියා තිබේ. ***"ක්‍රිස්තුස් වහන්සේ නුඹලාට ප්‍රේම කොට මිහිරි සුවඳක් පිණිස දෙවියන් වහන්සේට පූජාවක්ද, යාගයක් ද, කොට අප වෙනුවට තමන් ම පාවා දුන්නාක් මෙන් නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා"*** (එපීස 5:2) යේසුස් වහන්සේ ජීවත් වූවාක් මෙන් අපිත් ජීවත්වන්නේ නම් උන්වහන්සේ කලා වූ දේවල් අපිත් කරනවා ඇත. මනුෂ්‍යයා වෙනුවෙන් පාවිච්චි කිරීමට අපිත් අපගේ ජීවිත දෙවියන් වහන්සේට කැප කර දෙනවා ඇත. අපගේ ජීවිත උන්වහන්සේට භාරදුන් පසු තම තමන් උදෙසා නොව අනිත් අය උදෙසා ක්‍රියා කිරීමට සොයන්නෙමු. අපගේ ජීවිත දෙවියන් වහන්සේට පාවිච්චි කිරීමට අපි භාර දුන් විට අනිත් අයට හිමිකර දිය හැකි මොනවාදැයි දන්වා සිටින්නෙමු. ස්වර්ගයේ ඇති ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත් කාරකම් කිරීම අප වෙතට පැමිණි විට අපගේ ජීවිත වල මහත් බලවත් වූ දෙ අත්දකින්නෙමු.

ක්‍රිස්තුස්වහන්සේ තුල ඇති ඇදහිල්ල නිසා මහත් වූ කාරණා වලට හෝ උසස් වූ කැඳවීමට පැමිණීමට සිතන්නේ නම් සිතන්නේනම් ක්‍රිස්තුස් වහන්සේට අපගේ ජීවිතවල මැදහත් කාරකම් කිරීමට ඉඩ හැරිය යුතුය. උන්වහන්සේගේ ජයග්‍රහණය අපට ලබා දෙන සේක. යේසුස් වහන්සේ අපට පවසා තිබෙන දේට ඇහුම්කන් දෙන්න. ***"සැබෑවක් සැබෑවක් නුඹලාට කියමි. මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාත් කරන්නේ ය. මා පියාණන් වහන්සේ ළඟට යන නිසා ඊට වඩා මහත් ක්‍රියාත් ඔහු කරන්නේය."*** (යොහාන් 14:12) අපි ව්‍යවස්ථාව යටතේ නොවන බවත් මතක තබා ගැනීම වැදගත් ව තිබේ. නමුත් අපි සිටින්නේ කරුණාව යටතේ වීම වැදගත් කාරණයයි. උන්වහන්සේගේ කරුණාව අප සියල්ලන් තුළ ක්‍රියා කරන සේක. අපගේ අවශ්‍යතාවයන් වල දී දෙවියන් වහන්සේගේ පූර්ණත්වය හිමිකර ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේගේ සැපයීම ප්‍රමාණවත්ව තිබෙන සේක. ක්‍රිස්තුස් වහන්සේව සතුටු කරමින් උන්වහන්සේ තුළ මැදහත් කාරකම් කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේ අපව පුහුණු කරන සේක.

පිබිදීමේ පවිත්‍රතාවය

(*2016 මාර්තු මාසයට අයත් ප්‍රකාශයට පත් නොවූ ලිපියක කොටසකි.)

හැරල්ඩ් වෝගන් විසිනි

''මගේ ශුද්ධකම ඉහළ මට්ටමක පැවැතිය යුතු බව මම ඒත්තු ගනිමි. මනුෂ්‍යයාගේ යහපත සහ දෙවියන් වහන්සේගේ මහිමය උදෙසා මම ක්‍රියා කළ යුතුය. එමෙන්ම නිරතුරුවම යේසුස් වහන්සේගේ ලේ වලින් සේදීම ලබා හෘද සාක්ෂිය පවිත්‍රව තබා ගෙන සදාකාල ජීවනයට නොකඩවා පංගුකාර ත්වය පවත්වා ගත යුතුය. සෑම විටම ශුද්ධාත්මයෙන් පූර්ණ විය යුතුය. ලෝකයේ සිටින පව් කරුවන්ව ක්‍රිස්තුස් වහන්සේගේ මිදීම වෙතට ගෙන ඒමට හදවතින් පිපාසිතව සිටිය යුතුය. (රොබට් මරේ)

''පිබිදීම ශුද්ධ කමට සම්බන්ධතාවය ඇති ව තිබිය යුතුය. සැබෑ පිබිදීම ශුද්ධකමේ පිබිදීමයි.'' (ඩන්කන් කැම්පබෙල්) ***"මක්නිසාද, මා ශුද්ධව සිටින හෙයින් නුඹලාත් ශුද්ධව සිටිය යුතු යැයි ලියා තිබේ.***(1පේත්‍රුස් 1 :16)

දෙවියන් වහන්සේ මනුෂ්‍යයන් මතට පැමිණෙන්නේ නැතිව නැතිව ශුද්ධකම සඳහා දැල්වීමටත් ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමටත් පුළුවන් වන්නේ නැත. මෙම කාරණය පිළිබඳව උදාහරණයක් වශයෙන් 2 ලේකම් 29; වන පරිච්ඡේදයේ හෙසකියා රජතුමාගේ කාලයේ සිදු වූ අපූර්ව සිදුවීමක් පෙන්වා පෙන්වා දිය හැකිය. ස්වාමීන් වහන්සේගේ ගෘහයේ දොරවල් අළුත්වැඩියා කළාට පසුව හෙසකියා රජතුමා පූජකයන් සහ ලෙවිවරුන් රැස්කර ඔවුන්ට දුන් පළමුවන උපදේශය වූයේ ... ***"ලෙවිවරුනි ..., මට ඇහුම්කන් දියල්ලා. ...නුඹළාම දැන් පවිත්‍ර වී ..."*** (2 ලේකම් 29: 5)දෙවියන් වහන්සේගේ සෙනඟව පිබිදීම උදෙසා පාවිච්චි කිරීමට ප්‍රථම ඔවුන්ගේ ජීවිත යළි ප්‍රාණවත් වීම (පිබිදීම) අවශ්‍යය. ඊළඟට හෙසකියා රජු මෙසේ ආඥා කළේය. ***"....නුඹලාගේ පියවරුන්ගේ දෙවි වූ ස්වාමීන් වහන්සේගේ ගෘහයක් පවිත්‍ර කොට ශුද්ධ ස්ථානයෙන් කිලිටුකම පහ කරපල්ලා."*** (2 ලේකම් 29: 5) දේව මාලිගාවේ ඇතුළත තිබූ සියලු ආකාරයේ කිලුටු සහ අපවිත්‍ර දේවල් පිටතට ගෙනාවෝය. ***"පූජකයෝ ස්වාමීන් වහන්සේගේ ගෘහයත් පිරිසිදු කරන පිණිස එහි ඇතුළට ගොස් ස්වාමීන් වහන්සේගේ මාලිගාවෙහි සම්ඵ වුණු සියලු කිලුටු දේ, ස්වාමීන් වහන්සේගේ ගෘහයේ මළුවට ගෙනාවෝය."*** (2ලේකම් 29;16) මෙසේ දෙවියන් වහන්සේගේ ගෘහයේ පිරිසුදු කිරීම සඳහා දෙවිවරුන්ට දවස් 16 ක් ගතවිය. අපවිත්‍ර සහ භාවිතයට ගත නොහැකි දේවල් ක්‍රම ක්‍රමයෙන් වැඩි වූයේය . ඊශ්‍රායල් ජාතිය දෙවියන් වහන්සේ තෝරාගත් සෙනඟව සිටියෝය . තෝරාගනු ලැබුවා වූ දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේ නියම කරනු ලැබූ මාර්ග අනුගමනය කරනවා වෙනුවට තමන්ගේම පාපිෂ්ඨ මාර්ග වල ගමන් කරමින් සිටියෝය. එහි ප්‍රතිඵලය වශයෙන් දේව මාලිගාව සම්පූර්ණයෙන්ම පවිත්‍ර කිරීම අවශ්‍ය විය.

යම් කෙනෙක් අවංක වන්නේ නැතිව පිබිදීම ඔහු හෝ ඇය තුළ සම්පූර්ණ වන්නේ නැත. දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයන් ඔවුන්ගේ පාපය පිළිබඳව අවංකව විනිවිද පෙනෙන ලෙස කටයුතු කිරීමට විවෘත වීම තුළ පවිත්‍ර වෙමින් දෙවියන් වහන්සේගේ අභිමුකත්වය ප්‍රකාශ කළ යුතුය. දෙවියන් වහන්සේ අපටත් වඩා හොඳින් අපගේ හදවත් තුළ තත්ත්වය දන්නා සේක. අපගේ ශුද්ධ ස්ථානයේ තිබෙන සියලු අපවිත්‍ර කම් උන් වහන්සේ දැන සිටින සේක. අපගේ සිතුවිලි අභිප්‍රායන් අපගේ ආත්මයේ රහසින් තිබෙන දේ ආදී සියල්ල දෙවියන් වහන්සේ දන්නා සේක. පිබිදීම අපේක්ෂා කරන කෙනෙක් ආලෝකයට පැමිණීමට කැමතිවන්නේ නැතිව අන්ධකාරේ සිටිමින් පිබිදීම අත් දැකිය නොහැකි වේ. ක්‍රි.ව. 1737 දී ජෝන් වෙස්ලි මෙසේ ප්‍රකාශ කළේය. '' මගේ ජීවිතේ ශුද්ධකම ආරක්ෂා කර ගැනීම එක් ඉලක්කයකි.මක්නිසාද මා තුළ ශුද්ධකම පවත්වා ගන්නේ නැතිව අනිත් අයව ශුද්ධ කමට ගෙන ඒමට නොහැකිව තිබේ.'' ඉන් අවුරුදු 4කට පසුව ඔහු තම නිකායේ ප්‍රධානියා බවට පත් විය.

පුද්ගලික ශුද්ධකම

යම් කෙනෙක් සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේට කැප වී සිටින විට දෙවියන් වහන්සේගේ පිබිදීම ගෙන ඒමට එම පුද්ගලයාව දෙවියන් වහන්සේ පාවිච්චි කරන සේක. ඩේවිඩ් බර්නාඩ්ට උතුරු ඇමරිකානු ඉන්දියානුවරුන්ගේ ආගමික උත්සවයක් පැවැත්වූ එක් රාත්‍රියක එහි ප්‍රධාන අමුත්තා ලෙස සිටීමට සිදුවිය. ලී වලින් සාදා තිබූ දෙවිවරුන්ගෙන් ඉවතට ගොස් ඔහු දෙවියන් වහන්සේ සමග තනි වීමට උන් වහන්සේ වෙතට පැමිණියේය. මෙම අත්දැකීම පිළිබඳව ඔහු ඉතා ඕනෑකමින් මෙසේ ලිව්වේයි

''සියලුම පහත් දේවල් ක්‍රම ක්‍රමයෙන් පහව ගිය අතර ජීවිතයේ සහ හදවතේ ශුද්ධකම තරම් මේ දේවල් වැදගත් සැලකිය යුතු ඒවා ලෙස පෙනුනේ නැත. එමෙන්ම ඇමරිකානු ඉන්දියන්වරුන්ව දෙවියන් වහන්සේ වෙතට හරවා ගැනීම තරම් ඒ දේවල් වැදගත් දේවල් මෙන් පෙනුණේ නැත. මගේ සියලුම කනස්සල්ල බිය (තැතිගැන්ම) ලෞකික ස්වභාවයන් සහිත ආශාවන් ඉවත් ව යමින් හිමින් හමා එන්නාවූ සුළඟ ඉතා වැදගත් සහ උතුම්කොට සැලකුවෙමි. යේසුස් වහන්සේගේ නාමය ඉන්දියන් සෙනඟ අතරට ගෙනයාමත්, උන්වහන්සේගේ මහත් වූ මිදීම උදෙසා උන්වහන්සේට ආයාචනා කිරීමත්, මගේ ප්‍රධාන ප්‍රීතියත්, බලවත් වූ ආශාවත් උන් වහන්සේව එසවීම බවත් උන් වහන්සේ දන්නා සේක. '' මනුෂ්‍යයන් දෙවියන් වහන්සේ සමඟ ඒකත්වයට පැමිණ උන්වහන්සේගේ ශුද්ධකම තුළ පැවතීම අත්‍යවශ්‍ය ව තිබේ. ගීතිකාකරුවා තමන්ට කතා කිරීමට දෙවියන් වහන්සේට අවස්ථාව ලබා දුන්නේ ය. ***"දෙවියන් වහන්ස..., මා විමසා බලා, මගේ සිත දැනගත මැනව. මා පරීක්ෂාකොට, මගේ සිතුවිලි දැනගත මැනව. යම් නපුරු මාර්ගයක් මා තුළ ඇත්දැයි බලා සදාකාල මාර්ගයෙහි මා ගෙන ගිය මැනව"*** (ගීතාවලිය 139: 23- 24) ගීතිකාකරුවා මෙන් අපිත් අපගේ හදවත් සෝදිසි කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට ආරාධනා කරමින් උන්වහන්සේගේ ආලෝකය වෙතට හැරිය යුතුය. ක්‍රි.ව 1839 දී පිබිදීමක් පැමිණීමට පෙර පිබිදීම ඇති වූ ස්ථානයේ සිටි දේව දාසයා මෙසේ යාඥා කළේය. ''ස්වාමීන් වහන්ස..., පව්

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මූලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත,
මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

" නුමුත් උන්වහන්සේ වනාන්තර ස්ථානවලට අහක් ව ගොස් යාච්ඤා කළ සේක" (ලූක් 5-16)